# වාර්ෂික වාර්තාව - 2017
# வரு டாந்திர அறிக்கை - 2017
# ANNUAL REPORT - 2017



වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

நீர்ப்பாசன, நீர் வளச் முகாமைத்துவ அமைச்சு

MINISTRY OF IRRIGATION & WATER RESOURCES MANAGEMENT

## ජල සම්පත් මණ්ඩලය
## நீர் வளச் சபை
## WATER RESOURCES BOARD

# වාර්ෂික වාර්තාව

# 2017

**ජල සම්පත් මණ්ඩලය**

**වාරිමාර්ග හා ජල සම්පත්**

**කළමණාකරණ අමාත්‍යංශය**

# පටුන

**පිටු අංකය.**


| | |
|---|---|
| **හැඳින්වීම** ................................................................................. | 02 |
| **දැක්ම** ................................................................................. | 03 |
| **මෙහෙවර** ................................................................................. | 03 |
| **අරමුණු** ................................................................................. | 04 |
| **කාර්යයන්** ................................................................................. | 04 |
| **ආයතනික තොරතුරු** ................................................................. | 05 |
| **ආයතනික පාලන ව්‍යූහය** ........................................................... | 06 |
| පෙර ගමන්කරුවන් | |
| විගණන හා කළමනාකරණ කමිටුව | |
| ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් | |
| **වසරේ විශේෂ අවස්ථා** ................................................................. | 07 |
| **සේවකයින් සමඟ අංශ ස්ථානගත වීමේ ව්‍යූහය** ........................................... | 08 |
| **භෞතික හා මූල්‍ය ප්‍රගතිය** ........................................................... | 09 |
| **කාර්යය මණ්ඩල තොරතුරු** ........................................................... | 11 |
| **වටිනාකමින් වැඩි වත්කම්** ........................................................... | 13 |
| **ප්‍රධාන ක්‍රියාකාරකම්** ................................................................. | 14 |
| **2017 වර්ෂය තුල ක්‍රියාත්මක කරනු ලැබූ මෙහෙයුම් කාර්යයන්** .......................... | 15 |
| **වෙනත් ක්‍රියාකාරකම්** ................................................................. | 35 |
| **මූල්‍ය ප්‍රකාශන** ................................................................................. | 36 |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | |
| මූල්‍ය තත්ත්වය ප්‍රකාශය | |
| ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය | |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | |
| භාණ්ඩාගාර ප්‍රදාන අනාවරණය කිරීම | |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | |
| මූල්‍ය ප්‍රකාශයට සටහන් | |
| **විගණකාධිපති වාර්තාව** ................................................................. | 60 |
| **විගණකාධිපති වාර්තාව පිළිබඳ අදහස් දැක්වීම** ............................................ | 72 |
| **ඇමුණුම්** ................................................................................. | 81 |

## හැඳින්වීම

1964 අංක 29 දරණ ජල සම්පත් පනත යටතේ 1966 දී ස්ථාපිත කරන ලද ජල සම්පත් මණ්ඩලය ශ්‍රී ලංකාවේ ජල සම්පත් පාලනය හා ඵලදායී අයුරින් උපයෝගී කරගැනීම ආදී සියළු කරුනු පිළිබඳව විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් දෙන ආයතනයක් වශයෙන් පැවතිණි.

1978 දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ භූජල අංශය ජල සම්පත් මණ්ඩලයට අනුයුක්ත කරන ලද බැවින් මණ්ඩලයේ කාර්යයන් පුළුල්ව ක්‍රියාත්මක විය. උපදේශක සේවාවක්ව පැවති ජල සම්පත් මණ්ඩලය වාණිජමය කාර්යයන් හි නියැලීමට හැකිවන පරිදි හා ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පතට අදාළ කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීමට ජල සම්පත් මණ්ඩලයට බලය පවරාදීම සඳහා ජලසම්පත් මණ්ඩල පනත 1999 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර සංශෝධනය කරන ලදී.

2017 මාර්තු 16 වන දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍ර අංක 2010/23 අනුව දක්වන ලද කටයුතු සඳහා ස්වභාවික ජල උල්පත් හා භූගත ජලය භාවිතා කිරීමට ජල සම්පත් මණ්ඩලයේ අධීක්ෂණය හා මඟ පෙන්වීම ලබා ගත යුතු බව නියම කරන ලදී.

# දැක්ම

පිරිසිදු හා ආරක්ෂිත ජලය සැමට ප්‍රමාණවත් පරිදි ලබාදීම.

# මෙහෙවර

පොදු මහජනතාව, අදාල රාජ්‍ය දෙපාර්තමේන්තු/ අධිකාරී/ ආයතන/ ජාතික හා ජාත්‍යන්තර සංවිධාන හා දේශීය මෙන්ම විදේශීය විශේෂඥ සහ වෘතීයවේදී කණ්ඩායම් සමඟ සමීප සම්බන්ධතාවයක් ඇතිකර ගනිමින් ශ්‍රී ලංකාවේ භූ ගත ජල සම්පත තක්සේරු කිරීම, ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම සහ භාවිතා කිරීම සම්බන්ධයෙන් රජයට හා ජනතාවට උපදෙස් ලබාදීම.

# අරමුණු

- දිවයිනෙහි භූගත ජල සම්පත් පිළිබඳව පර්යේෂණ සිදු කිරීම.
- භූගත ජල සම්පත් පිළිබඳ වූ විද්‍යාත්මක දත්තයන් එක්රැස් කිරීම.
- භූගතӓ සමීක්ෂණ සිදු කිරීම.
- භූගත ජල සම්පත් පරිහරණය පිළිබඳ වූ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- භූගත ජල සම්පත් තක්සේරු කිරීම.
- වෙනත් ආයතන හා සම්බන්ධ වී මණ්ඩලයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම.
- භූගත ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය කිරීම.

# කාර්යයන්

භූගත ජල සම්පත් සංවර්ධනය සඳහා පවතින දත්තයන්හි භූ විද්‍යාත්මක අදහස් දැක්වීම.

භූගත ජල සම්පත් ගවේශණය පිණිස භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම.

භූගත ජල විභවයන් පවතින ස්ථාන හඳුනා ගැනීම.

භූගත ජල මූලාශ්‍ර පවතින ස්ථාන ඒවායේ විභවයන් හා ගුණාත්මක බව විද්‍යාත්මක ලෙස නිර්ණය කිරීම

භූගත ජල සම්පත් සංවර්ධනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයන් සිදු කිරීම.

රසායනික හා භෞතික ලක්ෂණ හඳුනාගැනීම සඳහා මෙන්ම ක්ෂුද්‍ර ජීවී සහ බැර ලෝහ සඳහා ද ජල නියැදියන් විශ්ලේෂණය කිරීම

භූ ජල දත්ත එක්රැස් කිරීම භූගත ජල දත්ත රැස්කර පවත්වාගෙන යාම සහ භූජල සිතියම් පිළියෙල කිරීම

# ආයතනික තොරතුරු

**ආයතනය**
ජල සම්පත් මණ්ඩලය

**නෛතික තත්වය**
රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලයකි

**ස්ථාපිත වර්ෂය**
1966 දී 1964 අංක 29 දරණ පාර්ලිමේන්තු පනත මඟින්.

1999 දී, 1999 අංක 42 දරණ ජල සම්පත් මණ්ඩල (සංශෝධන) පනත මගින් ඉහත පනත සංශෝධනය කරන ලදී.

**ප්‍රධාන කාර්යාලය**
අංක 02 ඒ,හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07
දුරකථන: +94 11 2694835, +94 11 2697050
ෆැක්ස්: +94 11 2669517 (පාලන)
ඊමේල්: helpdesk@wrb.gov.lk
වෙබ්:www.wrb.gov.lk

**රේඛීය අමාත්‍යාංශය**
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

**බදු හඳුනාගැනීමේ අංකය.**
409018017

**එ.අ.බ. ලියාපදිංචි අංකය.**
409018017 – 7000

**බැංකුකරුවන්**
ලංකා බැංකුව
ජාතික ඉතිරි කිරීමේ බැංකුව

**ආදායම් බදු උපදේශක**
ARS ඇසෝසියේට්
(වරලත් ගණකාධිකාරී)

**විගණකවරුන්**
විගණකාධිපති දෙපාර්තමේන්තුව
ප්‍රධාන අභ්‍යන්තර විගණක (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය)
අභ්‍යන්තර විගණක (ජල සම්පත් මණ්ඩලය)

**අධ්‍යක්ෂක මණ්ඩලය**

| | | |
|---|---|---|
| ඉංජි. ඒ.සී.එම්.සුල්ෆිකාර් මහතා | - | සභාපති |
| එස්.පී.වික්‍රමාරච්චි මහතා | - | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| එස්. සතිෂ් කුමාර් මහතා | - | අධ්‍යක්ෂ |
| ආර්.එම්.සී.රත්නායක මහතා | - | අධ්‍යක්ෂ |
| එච්.ටී.අශෝක ද මෙල් මහතා | - | අධ්‍යක්ෂ |
| එස්.කේ.එන්.සමන්මලී මිය | - | භාණ්ඩාගාර නියෝජිත |

**ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්**
ආර්.එස්.විජේසේකර මහතා
**සාමාන්‍යාධිකාරී**
ජී.ආර්.ආර්.කරුණාරත්න මහතා
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන)**
පී.පී.එස්.ආර්.කේ.පතිරණ මහතා
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)**
එම්.ඒ.පුෂ්පකුමාර මහතා
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා මුදල්)**
ඒ.බී.එම්.චන්ද්‍රසිරි මහතා
**සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)**
එම්.ජේ.දේශප්‍රිය මහතා
**සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)**
ආර්.එම්.එස්.රත්නායක මහතා
**සහකාර සාමාන්‍යාධිකාරී (භූජල)**
ජේ විජේසිරි මහතා
**සහකාර සාමාන්‍යාධිකාරී (පාලන)**

# ආයතනික පාලන ව්‍යුහය

## පෙර ගමන්කරුවන්

| | | | |
|---|---|---|---|
| i | ඉංජි. ඒ.සී.එම්.සුල්ෆිකාර් මහතා | - | සභාපති |
| ii | එස්.පී.වික්‍රමාරච්චි මහතා | - | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| iii | එස්.සතිෂ් කුමාර් මහතා | - | අධ්‍යක්ෂ |
| iv | ආර්.එම්.සී.රත්නායක මහතා | - | අධ්‍යක්ෂ |
| v | ටී.එච්.අශෝක ද මෙල් මහතා | - | අධ්‍යක්ෂ |
| vi | ජේ.කේ.එන්.සමන්මලී මිය | - | භාණ්ඩාගාර නියෝජිත |

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සමාලෝජිත වර්ෂය තුල අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් පහක් (05) පවත්වන ලදී .

## විගණන හා කළමනාකරණ කමිටුව

| | | | | | |
|---|---|---|---|---|---|
| i | ජේ.කේ.එන්.සමන්මලී මිය | - | සභාපති | - | භාණ්ඩාගාර නියෝජිත |
| ii | එස්.පී.වික්‍රමාරච්චි මහතා | - | සමාජික | - | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| iii | ටී.ඩබ්.එම්.පී.අයි.ඉන්දික බණ්ඩාර මහතා | - | සමාජික | - | අධ්‍යක්ෂ |
| iv | ආර්.එම්.සී.රත්නායක මහතා | - | සමාජික | - | අධ්‍යක්ෂ |
| v | ටී.එච්.අශෝක ද මෙල් මහතා | - | සමාජික | - | අධ්‍යක්ෂ |
| vi | ආර්.එස්.විජේසේකර මහතා | - | ලේකම් | - | සාමාන්‍යාධිකාරී |

### විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

2017 වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් (04) පවත්වන ලදී.

# වසරේ විශේෂ අවස්ථා

- ***2017 මාර්තු 16 වන දින පළ කරන ලද ගැසට් නිවේදනය මගින් ජල සම්පත් මණ්ඩලයේ බලය වැඩිදියුණු කිරීම.***

- ***ජල සම්පත් මණ්ඩල රසායනාගාරයේ නිල වෙබ් අඩවිය දියත් කිරීම.***
  ***(www.wrblabs.lk)***

- ***ශ්‍රී ලංකාවේ ජල සම්පත තිරසාර සංරක්ෂණය හා සංරක්ෂණය යන තේමාව යටතේ 2017 ලෝක ජල දිනය සැමරීම.***



# සේවකයින් සමඟ අංශ ස්ථානගත වීම් ව්‍යුහය (2017.12.31 දිනට)

ජල සම්පත් මණ්ඩලය

## ප්‍රධාන කාර්යාලය (අංශ/ඒකක)

| | කාර්යය මණ්ඩලය |
|---|---|
| භූජල | 20 |
| විදුම් | 08 |
| හදිසි මෙහෙයුම් අංශය | 03 |
| රසායනාගාරය | 05 |
| මෙහෙයුම් | 10 |
| පාලන | 15 |
| ගිණුම් | 11 |
| ප්‍රවාහන | 18 |
| ප්‍රසම්පාදන | 06 |
| නඩත්තු | 08 |
| අභ්‍යන්තර විගණන | 03 |
| | **107** |

**නිවාඩු ලබා විදේශගත සිටින සේවක සංඛ්‍යාව 03**

## පළාත් කාර්යාල

| | | කාර්යය මණ්ඩලය |
|---|---|---|
| රත්මලාන | කාර්යාලය | 29 |
| | ගබඩාව | 05 |
| | විදුම් ඒකක | 38 |
| පුත්තලම | කාර්යාලය | 18 |
| | රසායනාගාරය | 01 |
| | විදුම් ඒකක | 06 |
| අනුරාධපුර | කාර්යාලය | 19 |
| | රසායනාගාරය | 02 |
| | විදුම් ඒකක | 06 |
| යාපනය | කාර්යාලය | 06 |
| | රසායනාගාරය | - |
| | විදුම් ඒකක | 07 |
| මොණරාගල | කාර්යාලය | 14 |
| | විදුම් ඒකක | 09 |
| | | **160** |

# වර්ෂය තුල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

## වාණිජ අරමුදල් වල භෞතික ප්‍රගතිය - 2017

| ක්‍රියාකාරකම් | දෙසැම්බර් දක්වා සමස්ථ ඉලක්ක (ප්‍රමාණය) | දෙසැම්බර් දක්වා සමස්ථ භෞතික ප්‍රගතිය (ප්‍රමාණය) |
|---|---|---|
| භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම | 300 | 659 |
| නල ළිං ඉදිකිරීම | 200 | 166 |
| අත් පොම්ප සවි කිරීම | 75 | 32 |
| ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම | 125 | 215 |
| නල ළිං පිරිසිදු කිරීම | 26 | 36 |
| ජල සාම්පල විශ්ලේෂණය කිරීම | 500 | 756 |
| යකඩ පෙරණ සවි කිරීම | 50 | 34 |



# වාණිජ අරමුදල් වල මූල්‍ය ප්‍රගතිය - 2017

| ක්‍රියාකාරකම් | අයවැය ගත<br>රු.000 | සත්‍ය<br>රු.000 |
|---|---|---|
| භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම | 24,000 | 29,819 |
| නල ළිං ඉදිකිරීම | 67,500 | 78,059 |
| අත් පොම්ප සවි කිරීම | 7,200 | 7,666 |
| ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම | 22,500 | 20,677 |
| නල ළිං පිරිසිදු කිරීම | 3,000 | 2,488 |
| ජල සාම්පල විශ්ලේෂණය කිරීම | 3,000 | 2,055 |
| යකඩ පෙරණ සවි කිරීම | 4,000 | 3,724 |



# 2017.12.31 දිනට කාර්යය මණ්ඩලය

| වැටුප් තලය | අනුමත කාර්යය මණ්ඩලය | වර්තමාන කාර්යය මණ්ඩලය |
|---|---|---|
| | ස්ථිර | ස්ථිර |
| HM | 11 | 11 |
| MM | 47 | 27 |
| JM | 27 | 16 |
| MA | 92 | 47 |
| PL | 236 | 169 |
| එකතුව | 413 | 270 |



# 2017.12.31 දිනට කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය

| තනතුර | වැටුප් තලය | අනුමත සේවක මණ්ඩලය | වර්තමාන සේවක මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| සාමාන්‍යාධිකාරී | HM | 1 | 1 | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | HM | 3 | 3 | |
| සහකාර සාමාන්‍යාධිකාරී | HM | 7 | 7 | |
| පළාත් කළමනාකරු | MM | 5 | 5 | |
| භූජල විද්‍යාඥ/ ජ්‍යෙෂ්ඨ භූජල විද්‍යාඥ | MM | 23 | 15 | 8 |
| ඉංජිනේරු (යාන්ත්‍රික) | MM | 1 | 1 | |
| ඉංජිනේරු (සිවිල්) | MM | 2 | | 2 |
| රසඥ | MM | 7 | 4 | 3 |
| කළමනාකරු (විදුම්) | MM | 3 | | 3 |
| අභ්‍යන්තර විගණක | MM | 1 | | 1 |
| ගණකාධිකාරී | MM | 1 | 1 | |
| කළමනාකරු (පාලන) | MM | 1 | | 1 |
| කළමනාකරු (ප්‍රසම්පාදන) | MM | 1 | 1 | |
| නීති නිලධාරී | MM | 1 | | 1 |
| ජ්‍යෙෂ්ඨ ජල විශ්ලේෂක | JM 1-1 | 1 | 1 | |
| පුද්ගලික සහකාර - සභාපති | JM 1-1 | 1 | 1 | |
| පුද්ගලික සහකාර - සාමාන්‍යාධිකාරී | JM 1-1 | 1 | 1 | |
| පාලන නිලධාරී | JM 1-1 | 2 | 2 | |
| ගිණුම් නිලධාරී | JM 1-1 | 1 | 1 | |
| ප්‍රවාහන/ ප්‍රවර්ධන නිලධාරී | JM 1-1 | 1 | | 1 |
| පරිසර නිලධාරී | JM 1-1 | 1 | | 1 |
| විගණන නිලධාරී | JM 1-1 | 1 | | 1 |
| පුස්ථකාලාධිපති | JM 1-1 | 1 | | 1 |
| තොරතරු තාක්ෂණ නිලධාරී | JM 1-1 | 1 | 1 | |
| ඉංජිනේරු සහකාර (සිවිල්) | JM 1-1 | 4 | 4 | |
| ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික) | JM 1-1 | 2 | | 2 |
| ගබඩා අධිකාරී | JM 1-1 | 1 | 1 | 0 |
| ප්‍රසම්පාදන නිලධාරී | JM 1-1 | 1 | | 1 |
| විදුම් අධිකාරී | JM 1-1 | 6 | 3 | 3 |
| ප්‍රගති අධීක්ෂණ නිලධාරී | JM 1-1 | 1 | | 1 |
| සැලසුම් නිලධාරි සහකාර | JM 1-1 | 1 | 1 | |
| තාක්ෂණික සහකාර (සිවිල්) | MA 2-2 | 7 | 1 | 6 |
| තාක්ෂණික සහකාර (යාන්ත්‍රික) | MA 2-2 | 6 | | 6 |
| සහකාර විදුම් අධිකාරී | MA 2-2 | 14 | 10 | 4 |
| සැලසුම් ශිල්පී | MA 2-2 | 4 | | 4 |
| ජල විශ්ලේෂක | MA 2-2 | 10 | 1 | 9 |
| වැඩ පරීක්ෂක | MA 2-2 | 2 | | 2 |
| වැඩබිම් පරීක්ෂක | MA 2-2 | 2 | | 2 |
| පද්ධති ක්‍රියාකරු | MA 2-2 | 1 | | 1 |
| ගිණුම් සහකාර | MA 2-2 | 2 | 2 | |
| ගබඩා භාරකරු | MA 2-2 | 3 | 2 | 1 |
| තොරතුරු තාක්ෂණ ශිල්පී | MA 2-2 | 1 | | 1 |
| කළමනාකරණ සහකාර | MA 2-1 | 2 | 2 | |
| කළමනාකරණ සහකාර | MA 1-2 | 37 | 29 | 8 |
| ආරක්ෂක නිලධාරී/ සහකාර | MA 1-2 | 1 | | 1 |
| විදුම් යාන්ත්‍රික ශිල්පී රියදුරු | PL 3 | 7 | | 7 |
| මේසන් | PL 3 | 3 | 1 | 2 |
| ජල නල කාර්මික | PL 3 | 4 | | 4 |
| රියදුරු | PL 3 | 50 | 41 | 9 |
| වෑද්දුම් ශිල්පී/ පෑස්සුම් ශිල්පී | PL 3 | 3 | 2 | 1 |
| මෝටර් කාර්මික | PL 3 | 2 | 2 | |
| පට්ටල්කරු/පෑස්සුම් ශිල්පී | PL 3 | 1 | 1 | |
| විදුලි කාර්මික | PL 3 | 1 | 1 | |
| මෝටර් විදුලි කාර්මික | PL 3 | 1 | | 1 |
| තහඩු වැඩ ශිල්පී / පින්තාරු ශිල්පී | PL 3 | 2 | 1 | 1 |
| බර යන්ත්‍ර ක්‍රියාකරු | PL 3 | 2 | | 2 |
| විදුම් යන්ත්‍ර ක්‍රියාකරු සහ රියදුරු | PL 3 | 7 | 4 | 3 |
| විදුම් සහයක | PL 2 | 7 | 5 | 2 |
| නඩත්තු සහයක | PL 2 | 3 | 3 | |
| සංචාරක නිවාස භාරකරු | PL 2 | 1 | 1 | |
| කම්කරු | PL 1 | 105 | 81 | 24 |
| කාර්යාල සහයක | PL 1 | 23 | 12 | 11 |
| ආරක්ෂක නිලධාරී | PL 1 | 14 | 14 | |
| **එකතුව** | | **412** | **270** | **142** |

# වටිනාකමින් වැඩි වත්කම්

## වාහන, යන්ත්‍ර සහ උපකරණ

| වර්ගය | ප්‍රමාණය | වටිනාකම රු. |
|---|---|---|
| වාහන | | |
| ඩබල් කැබ් | 17 | 57,900,000.00 |
| ලොරි | 15 | 34,350,000.00 |
| මෝටර් රථ | 02 | 1,900,000.00 |
| ජීප් | 01 | 400,000.00 |
| සිංගල් කැබ් | 01 | 150,000.00 |
| ත්‍රී රෝද රථ | 01 | 225,000.00 |
| **එකතුව** | **37** | **94,925,000.00** |
| යන්ත්‍ර | | |
| විදුම් යන්ත්‍ර | 16 | 73,000,000.00 |
| වායු පීඩන යන්ත්‍ර (ලොරි රථයට සම්බන්ධ කල) | 12 | 81,100,000.00 |
| පොම්ප ඒකක | 03 | 18,800,000.00 |
| **එකතුව** | **31** | **172,900,000.00** |
| විද්‍යාත්මක උපකරණ | | |
| ප්‍රතිරෝධකතා මීටර | 10 | 26,531,500.00 |
| භූ භෞතික දත්ත ලබා ගැනීමේ උපකරණ | 02 | 14,166,900.00 |
| DGPS | 01 | 2,000,000.00 |
| **එකතුව** | **13** | **42,698,400.00** |
| රසායනාගාර උපකරණ | | |
| Atomic Absorption Spectro Unit | 02 | 3,000,000.00 |
| pH Meter | 15 | 1,092,976.00 |
| Flame Photometer | 03 | 1,930,000.00 |
| **එකතුව** | **13** | **6,022,976.00** |

# ප්‍රධාන ක්‍රියාකාරකම් ..........

නල ළිං ඉදිකිරීම





ජල ධාරිතා පරීක්ෂණ





භූජල සමීක්ෂණ



ජල සාම්පල පරීක්ෂාව



# ජල සම්පත් මණ්ඩලය විසින් 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබූ මෙහෙයුම් කාර්යයන්

ජල සම්පත් මණ්ඩලයේ වගකීම් සහ කාර්යයන් සම්බන්ධ සියලු මෙහෙයුම් කාර්යයන් ප්‍රධාන වශයෙන් භූජල අංශය සහ මෙහෙයුම් අංශය මගින් සිදු කරනු ලැබේ.

2017 වර්ෂය සඳහා ජල සම්පත් මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘති සියල්ල භූජල අංශය, විදුම් අංශය සහ පළාත් කාර්යාල මගින් සිදු කරන ලදී. එම වැඩසටහන් සහ ව්‍යාපෘති පහත සඳහන් පරිදි වේ.

1. 2017.03.16 දිනැති අති විශේෂ ගැසට් පත් අංක 2010/23 මගින් පවරා ඇති භූගත ජලය සම්බන්ධ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

2. දිවයිනේ භූගත ජලය කළමනාකරණය කිරීමේ අරමුණ සහිතව පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු සිදු කිරීම. මෙම ව්‍යාපෘති භාණ්ඩාගාර සහ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලදී.

3. මහජනතාව, රාජ්‍ය ආයතන සහ අනෙකුත් ආයතන මගින් ඔවුන්ගේ අවශ්‍යතාවය මත කරනු ලැබූ ඉල්ලීම් මත භූගත ජල සංවර්ධන කටයුතු සිදුකිරීම

## 1. 2017.03.16 දිනැති අති විශේෂ ගැසට් පත් අංක 2010/23 මගින් පවරා ඇති භූගත ජලය සම්බන්ධ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

ගැසට් පත් අංක 2010/23 මඟින් පවරන ලද භූගත ජලය සම්බන්ධ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා සභාපතිතුමාගේ උපදෙස් මත කටයුතු කිරීම පිණිස ජල සම්පත් මණ්ඩලයේ කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයේ ක්ෂණික මෙහෙයුම් ඒකකයක් ආරම්භ කරන ලදී. මෙහිදී, දිවයින පුරා සියලු ප්‍රදේශ වල අවිධිමත් ලෙස නල ළිං ඉදිකිරීම නැවැත්වීම සහ එවැනි අවස්ථා අවම කිරීම පිළිබඳව සහ භූගත ජල කළමනාකරණය සඳහා අවශ්‍ය වන සාධකයක් ලෙස ශ්‍රී ලංකාව පුරා ඉදිකර ඇති ගැඹුරු නල ළිං වල දත්ත එක්රැස් කර විස්තරාත්මක දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම පිළිබඳව ජල සම්පත් මණ්ඩලයේ අවධානය ප්‍රධාන වශයෙන් යොමු කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කාර්යයන් 2017 වර්ෂයේදී සිදු කරන ලදී.

(අ) ගැඹුරු නල ළිං ඉදිකරනු ලබන පුද්ගලික අංශයේ ආයතන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි කිරීම සහ පවතින රෙගුලාසි අනුව කටයුතු කිරීම සඳහා එකඟතා ගිවිසුම් ඇති කර ගැනීම.

(ආ) එසේම, ගැඹුරු නල ළිං ඉදිකිරීම සඳහා මූලික භූගත ජල අධ්‍යයන සිදු කිරීම පිණිස සුදුසුකම්ලත් බාහිර භූ විද්‍යාඥයින් තෝරාගෙන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි කිරීම.

2017 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද ගැඹුරු නල ළිං ඉදිකරනු ලබන ආයතන සහ බාහිර භූජල විද්‍යාඥයින් ප්‍රමාණය වගුව 1 මගින් දැක්වේ.

*වගුව 1 : 2017 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද ගැඹුරු නල ළිං ඉදිකරනු ලබන පුද්ගලික ආයතන සහ බාහිර විද්‍යාඥයින් ප්‍රමාණය*

| ලියාපදිංචි කරන ලද ගැඹුරු නල ළිං ඉදිකරනු ලබන පුද්ගලික ආයතන ප්‍රමාණය | ලියාපදිංචි කරන ලද බාහිර භූ විද්‍යාඥයින් ප්‍රමාණය |
|---|---|
| 120 | 13 |

**2.** දිවයිනේ භූගත ජලය කළමනාකරණය කිරීමේ අරමුණ සහිතව පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු සිදු කිරීම . මෙම ව්‍යාපෘති භාණ්ඩාගර සහ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලදී.

## 2.1 භාණ්ඩාගාර ප්‍රතිපාදන ව්‍යාපෘති

වගුව 2 : 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද භාණ්ඩාගාර ප්‍රතිපාදන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකාවේ වඩාත් සංවේදී භූගත ජල කලාපයන්හි ජලයේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක භාවය පිළිබඳ දීර්ඝ කාලීන දත්ත එක්රැස් කිරීම සහ අධීක්ෂණය (කොළඹ - මීගමුව වැලි සහිත ජල ධරය, පුත්තලම හුණුගල් සහිත ජල ධරය සහ කල්පිටිය වැලි සහිත ජල ධරය, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කලාප, වවුනියාව සහ කිළිනොච්චි දිස්ත්‍රික්ක, යාපනය අර්ධද්වීපය, කැළණි ගංගා ද්‍රෝණිය) (රු. මිලියන 2.5) | ප්‍රධාන කාර්යාලය , කොළඹ |
| 02 | යාපනය අර්ධද්වීපය ආවරණය වන පරිදි භූගත ජල නිමාන (අධීක්ෂණ) ව්‍යාපෘතිය (රු. මිලියන 3.5) | යාපනය පළාත් කාර්යාලය |
| 03 | කාලගුණික විපර්යාසයන් හේතු කොටගෙන වෙරළාසන්න භූගත ජල ධරයන්ට ඇතිවිය හැකි ඍජු හා වක්‍ර බලපෑම පිළිබඳ අධ්‍යයනය(රු. මිලියන 2.5) | ප්‍රධාන කාර්යාලය , කොළඹ |
| 04 | හඳුනා නොගත් වකුගඩු ආශ්‍රිත රෝගය පවතින අම්පාර, කුරුණෑගල, ත්‍රිකුණාමලය, හම්බන්තොට, බදුල්ල, මොණරාගල සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල ජලයේ ගුණාත්මකතාවය පිළිබඳ අධ්‍යයනය (රු. මිලියන 5.0) | අනුරාධපුරය, පුත්තලම සහ මොණරාගල පළාත් කාර්යාල |
| 05 | කිරිඳිඔය ජල ද්‍රෝණියේ භූගත ජලය පිළිබඳ ඇගයීම (රු. මිලියන 1.6) | මොණරාගල පළාත් කාර්යාලය |
| 06 | හදිසි ආපදා අවශ්‍යතා සඳහා භූගත ජල ප්‍රභව සංවර්ධනය (රු. මිලියන 4.6) | ප්‍රධාන කාර්යාලය, කොළඹ |
| 07 | වියළි කළාපීය ප්‍රදේශවල නල ළිං සහ අත්පොම්ප ප්‍රතිසංස්කරණය කිරීම (රු. මිලියන 2.3) | ප්‍රධාන කාර්යාලය, කොළඹ |
| 08 | අදාල අනෙකුත් රාජ්‍ය ආයතන සමග ඒකාබද්ධව භූගත ජල සම්පත් ක්ෂය වීම සහ දූෂණය වීම ආශ්‍රිත පාරිසරික ගැටළු පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම (රු. මිලියන 0.5) | ප්‍රධාන කාර්යාලය , කොළඹ |

මෙම ව්‍යාපෘති යටතේ සිදු කරන ලද කාර්යයන් පහත දැක්වෙන පරිදි වේ.

### 2.1.1 ශ්‍රී ලංකාවේ වඩාත් සංවේදී භූගත ජල කලාපයන්හි ජලයේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක භාවය පිළිබඳ දීර්ඝ කාලීන දත්ත එක්රැස් කිරීම සහ අධීක්ෂණය (රු. මිලියන 2.5)

මෙය දැනට ක්‍රියාත්මක වන අධීක්ෂණ ව්‍යාපෘතියක් වන අතර විවිධ ප්‍රදේශවල මතුපිට ජලයේ, ගැඹුරු සහ නොගැඹුරු ජලයේ ගුණාත්මකභාවය පැතිරී ඇති ආකාරය හඳුනාගැනීම සඳහා මෙම අධ්‍යයනය ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය ජල සම්පත් මණ්ඩලය මගින් දැනට අවසන් කර ඇති ව්‍යපෘති 6ක් එක්කර භූගත ජලය පිළිබඳව දීර්ඝ කාලීන නිමාන කටයුතු සිදු කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබේ. භූගත ජල නිමාන පද්ධතියක් ස්ථාපනය කිරීමේ අරමුණ ඇතිව මෙම ව්‍යාපෘතිය ආරම්භයේදී, එක් එක් ව්‍යාපෘතිය මගින් හඳුනාගන්නා ලද භූගත ජලය සම්බන්ධ ගැටළු පවතින ප්‍රදේශවල පර්යේෂණ නල ළිං ඉදි කරන ලදී . එලෙස ඉදිකරන ලද පර්යේෂණ නල ළිං වල විස්තර පහත වගුව මගින් දැක්වේ.

**වගුව 3 : ශ්‍රී ලංකාවේ වඩාත් සංවේදී භූගත ජල කලාපයන්හි ජලයේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක භාවය පිළිබඳ දීර්ඝ කාලීන දත්ත එක්රැස් කිරීම සහ අධීක්ෂණය යටතේ ඉදිකරන ලද නල ළිං පිළිබඳ විස්තර**

| අනු අංකය | ව්‍යාපෘතිය | ප්‍රදේශය | ඉදිකරන ලද පර්යේෂණ නල ළිං සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | කොළඹ සිට මීගමුව දක්වා දිවෙන වැලි සහිත නොගැඹුරු ජල ධරය පිළිබඳව සිදු කරනු ලබන සවිස්තරාත්මක භූජල විද්‍යාත්මක අධ්‍යයනය | කොළඹ සිට මීගමුව දක්වා වෙරළාසන්න වැලි සහිත ජල ධරයට අදාල ප්‍රදේශ | 78 |
| 2. | පුත්තලම දිස්ත්‍රික්කයේ භූගත ජලය කෘතීමව ආරෝපරණය කිරීමට සුදුසු ප්‍රදේශ හඳුනාගැනීමේ භූජල විද්‍යාත්මක අධ්‍යයනය | පුත්තලම සහ කල්පිටිය ප්‍රදේශ | 14 |
| 3. | කැළණි ගංගා ද්‍රෝණිය සම්බන්ධව සිදු කරන භූජල විද්‍යාත්මක අධ්‍යයනය | කැළණි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ප්‍රදේශ | 10 |
| 4. | අනුරාධපුර දිස්ත්‍රික්කය තුල සිදු කරන දීර්ඝ කාලීන භූ ජල විද්‍යා අධ්‍යයනය | අනුරාධපුරය දිස්ත්‍රික්කය | 32 |
| 5. | වව්නියා-කිලිනොච්චි ප්‍රදේශ ආවරණය කරමින් සිදු කරන භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය | වවුනියාව සහ කිළිනොච්චි ප්‍රදේශ | 35 |
| 6. | මන්නාරම දිස්ත්‍රික්කයේ පවතින හුණු ගල් සහිත ජලධරය පිළිබඳව සිදු කරන භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය | මන්නාරම දිස්ත්‍රික්කය | 55 |

2017 වසර තුල මෝසම් වර්ෂා කාලයට පෙර සහ පසු වශයෙන් සෑම කාර්තුවකදීම, මෙම ව්‍යාපෘතිය යටතේ ස්ථාපනය කරන ලද භූගත ජල නිමාන ජාලයට අදාල ප්‍රදේශවල භූගත ජලයේ ගුණාත්මකතාවය සහ ජල මට්ටම් නිමානය කිරීම සිදු කරන ලදී. එම නිමාන දත්තවල ප්‍රතිඵල පදනම් කර ගනිමින්, ඉහල යන කාර්මික සංවර්ධනය, කෘෂිකාර්මික කටයුතු වලදී යොදාගනු ලබන පොහොර වර්ග සහ අනෙකුත් උපකෘත සැකැස්මේ ස්වභාවික වෙනස් වීම් නිසා අදාල ප්‍රදේශවල ජල මට්ටම්වල සහ ජලයේ ගුණාත්මකභාවයේ වෙනස්වීම් හඳුනාගැනීම සඳහා නිමාන කටයුතු ඉදිරි වර්ෂ 5ක කාලයකට දීර්ඝ කිරීමට තීරණය කරන ලදී.

## 2.1.2 යාපනය දිස්ත්‍රික්කයේ භූගත ජල නිමාන ජාලය සංවර්ධනය කිරීම (රු.මිලියන 3.5)

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ තෝරාගත් ප්‍රදේශවල භූගත ජලයේ ස්වභාවය හඳුනාගැනීම සහ දැනුවත් කිරීමේ වැඩ සටහන් ආරම්භ කර භූගත ජලය වර්ධනය වීම නිරීක්ෂණය කිරීම සඳහා දීර්ඝ කාලීන නිමාන ජාලයක් ස්ථාපනය කිරීම සහ අවසානයේදී ප්‍රදේශයේ භූගත ජල ආකෘතියක් සකස් කිරීම වේ.

ප්‍රධාන අරමුණට අමතරව,කෘෂිකාර්මික කටයුතු, බැක්ටීරියා සහ අනෙකුත් හේතූන් නිසා භූගත ජල ප්‍රභවයන්ට සිදුවන බලපෑම සලකා බැලීම තුලින් යාපනය අර්ධද්වීපයේ පිරිසිදු භූගත ජලය පවතින ප්‍රදේශ හඳුනාගැනීම සිදු කරන ලදී. තවද, හුණුගල් ආශ්‍රිත ජල ධරයේ භූගත ජලයේ පැරාමිතීන් පිළිබඳ සලකා බලා භූගත ජල සංයුතිය පිළිබඳ අදාල පාලනයන් කිරීම සඳහා නිර්දේශ ලබා දීමට ද අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ පහත දැක්වෙන කාර්යයන් 2017 වර්ෂයේ දී සිදු කරන ලදී.

**වගුව 4 : ව්‍යාපෘතිය යටතේ යාපනය අර්ධද්වීපය තුල සිදු කරන ලද ක්‍රියාකාරකම්**

| අනු අංකය | කාර්යය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | භූවිද්‍යා සමීක්ෂණ සිදු කිරීම | 15 |
| 02 | පර්යේෂණ නල ළිං ඉදිකිරීම | 15 |
| 03 | ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම | 15 |
| 04 | සම්මත මිම්මකට අනුව ළිංවල ජල මට්ටම් නිර්ණය කිරීම | 15 |
| 05 | ජල නියැදීන් ලබා ගැනීම සහ දත්ත නිමාන කටයුතු සිදු කිරීම | 600 |
| 06 | ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම | 300 |

ලබාගත් ජල නියැදීන් විශ්ලේෂණය කිරීමෙන් ලැබුණු ප්‍රතිඵල අනුව විද්‍යුත් සන්නායකතාවය, ලවණතාවය, නයිට්‍රේට්, ටීඩීඑස්, ක්ලෝරයිඩ් සහ ජල මට්ටම්වල මෝසම් වර්ෂා කාලයට පෙර සහ පසු වෙනස් වීම් සිදුවන බව පෙනී ගොස් ඇත. එබැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශය තුල ජලයේ ගුණාත්මකභාවය සහ ජල මට්ටම් විචලනය වීම පරීක්ෂා කිරීම සඳහා ඉදිරි වර්ෂ 05 තුල මෙම නිමාන වැඩසටහන නොනවත්වා ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.



*රූපසටහන 01 : ක්ෂේත්‍රයේදී ජල නියැදීන් විශ්ලේෂණය සිදුකරන ආකාරය*

**2.1.3 කාලගුණික විපර්යාසයන් හේතුකොට ගෙන වෙරළාසන්න භූගත ජල ධරයන්ට ඇතිවිය හැකි සෘජු හා වක්‍ර බලපෑම පිළිබඳ අධ්‍යයනය (රු .මිලියන (2.5)**

මෙය භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතියක් වන අතර කාළගුණික වෙනස්වීම් නිසා දිවයිනේ බස්නාහිර සහ නැගෙනහිර වෙරළාසන්න ජල ධරයන්ට ඇතිවිය හැකි භූගත ජලය පිළිබඳ ගැටළු හඳුනාගැනීම සඳහා 2015 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වනුයේ කාලයත් සමග ජලයේ ගුණාත්මකභාවයේ වෙනස්වීම සහ ජල මට්ටම්වල විචලනය හඳුනාගැනීම, මුහුදු ජලය සහ පිරිසිදු ජලය මිශ්‍ර වන අතුරු මුහුණත හඳුනා ගැනීම, වෙරළාසන්න ජල ධරයේ ලවණතා මට්ටම් වෙනස් වීම හඳුනාගැනීම සහ භූගත ජලය වඩාත් ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා ක්‍රමවත් යාන්ත්‍රණයක් හඳුන්වා දීම වේ.

ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගැනීම පිණිස කොළඹ සිට වැලිගම දක්වා බස්නාහිර වෙරළාසන්න කලාපය තුල සහ නැගෙනහිර වෙරළ තීරයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිමාන ජාලයක් ස්ථාපනය කිරීම සඳහා ළිං 74ක් තෝරාගන්නා ලදී. (නොගැඹුරු ළිං 50ක් සහ පර්යෙෂණ ළිං 24ක්)

මීට අමතරව නැගෙනහිර වෙරළ තීරයේ භූගත ජල නිමාන ප්‍රදේශය මුලතිවු දිස්ත්‍රික්කය දක්වා පුළුල් කිරීම සඳහා මුලතිවු දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශවල පර්යේෂණ නල ළිං 08ක් ඉදිකරන ලදී. මෙම නල ළිං වල ජල ධාරිතාව විනාඩියකට ලීටර් 30 සිට ලීටර් 750 දක්වා විය.

මෙම ඉදිකරන ලද පර්යේෂණ නල ළිං මගින් අවට පරිසරයට හානියක් ඇති නොවී ලබාගත හැකිඋපරිම ආරක්ෂිත ජල ධාරිතාව නිර්ණය කිරීම සඳහා සහ විද්‍යුත් සන්නායකතා අගයන් සලකා බලා මුහුදු ජලය මිශ්‍රවීම සම්බන්ධයෙන් නිර්ණය කිරීම  සඳහා ජල ධාරිතා පරීක්ෂණ ද සිදු කරන ලදී.

නිමාන කටයුතු වලින් ලබාගත් දත්ත විශ්ලේෂණ ප්‍රතිඵල අනුව විද්‍යුත් සන්නායකතාවය සහ ලවණතාවය වැනි පැරාමිතීන්ගේ අගයන් වියලි කාලයේදී ඉහල යන බවත් තෙත් කාලයේදී පහල යන බවත්  පෙනී ගොස් ඇත. කලපුව ආසන්නයේදී නොගැඹුරු භූගත ජලයේ ගුණාත්මකභාවය ඉතා අඩු නමුත් මුහුද ආසන්නයේදී ගුණාත්මකභාවය සංසන්දනාත්මකව හොඳ තත්වයක පවතී.  වර්ෂාපතන රටාව අනුව සහ වඩදිය බලපෑම අනුව ජල මටටම් අඩු වැඩි වීම, ජල ධරයේ ජලයේ ගුණාත්මකභාවය මේ අයුරින් වෙනස් වීමට බලපා ඇති බව පෙනී යයි. එසේ වුවද වඩදියබලපෑම හඳුනාගැනීම අසීරු කරුණකි.




රූපසටහන **02:** නැගෙනහිර වෙරළ තීරයේ භූගත ජලයේ රසායනික පැරාමිතීන්ගේ විචලනය දැක්වෙන සිතියම්

නිර්දේශ සහ අනාගත සැලසුම්

- වෙරළාසන්න ජල ධරවල භූගත ජලයේ රසායනික පැරාමිතීන් කාළගුණික විපර්යාස අනුව වෙනස් වන ආකාරය නිමානය කිරීම
- ජල මට්ටම් විචලනය වීම හඳුනාගැනීම
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වෙරළාසන්න ජල ධරයේ භූගත ජලයේ ලවණතාවය, විද්‍යුත් සන්නායකතාවය, pH අගය සහ ක්ලෝරයිඩ් මට්ටම විචලනය වන අකාරය නිර්ණය කිරීම
- සමස්ථානික (isotope)තාක්ෂණය භාවිතා කරමින් භූගත ජලයට මුහුදු ජලය මිශ්‍ර වී ඇති ප්‍රදේශ හඳුනාගැනීම
- ඇතිවිය හැකි කාළගුණික තත්වයන් නිසා වෙරළාසන්න වැලි සහිත ජල ධරයට සිදුවිය හැකි බලපෑම් සහ අවදානම් ප්‍රදේශ හඳුනා ගැනීම
- භූගත ජලය කෘතිමව ආරෝපණය කල හැකි ප්‍රදේශ හඳුනා ගැනීම

### 2.1.4 හඳුනානොගත් වකුගඩු ආශ්‍රිත රෝගය පවතින අම්පාර ,කුරුණෑගල ,ත්‍රිකුණාමලය ,හම්බන්තොට , බදුල්ල ,මොණරාගල සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ අධ්‍යයනය (රු.මිලියන 5.0)

හඳුනා නොගත් වකුගඩු රෝගය (CKD) මුලින්ම වාර්තා වූයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශ වලිනි. මෑතකදී අම්පාර, කුරුණෑගල, ත්‍රිකුණාමලය, හම්බන්තොට, පොළොන්නරුව සහ බදුල්ල යන දිස්ත්‍රික්කවලින් ද වාර්තා විය. කෘෂිකර්මාන්තය සඳහා කෘෂි රසායනික සහ පොහොර වැඩි වශයෙන් භාවිතා කිරීම මෙම රෝගය සඳහා හේතුවන එක් කරුණක් ලෙස විශ්වාස කෙරේ. භූගත ජලෙයහි සනත්වය සහ ෆ්ලෝරයිඩ් ප්‍රමාණය ද මෙම වකුගඩු රෝගය සඳහා තවත් හේතූන් ලෙස සැලකේ. එබැවින්, වකුගඩු රෝගය පැතිර පවතින ප්‍රදේශවල භූගත ජලයේ ගුණාත්මකභාවය නිමානය කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලය විසින් 2014 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. 2017 වර්ෂයේ දී මෙම අධ්‍යයනය කුරුණෑගල, මොණරාගල, බදුල්ල සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලද අතර සිදුකරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි වේ.

*වගුව 06 : හඳුනානොගත් වකුගඩුආශ්‍රිතරෝගය පවතිනදිස්ත්‍රික්කවලජලයේ ගුණාත්මකභාවය පිළිබඳ අධ්‍යයනය යටතේ සිදු කරන ලද කාර්යයන්*

| අනු අංකය | කාර්යය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම | 20 |
| 02 | පර්යේෂණ නල ළිං ඉදිකිරීම | 20 |
| 03 | ජල නියැදීන් ලබා ගැනීම සහ දත්ත නිමාන කටයුතු සිදු කිරීම | 500 |
| 04 | ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම | 150 |
| 05 | ජල සායන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 10 |
| 06 | අත්පොම්ප නල ළිං සවි කිරීම | 20 |

හඳුනා නොගත් වකුගඩු රෝගය පවතින ප්‍රදේශවල ජනතාව සිය එදිනෙදා කටයුතු සඳහා භාවිතා කරන සහ බීමට ගන්නා ජලයේ ගුණාත්මකභාවය ම කටයුතු සඳහා සුදුසු තත්වයේ පවතින බව මෙහිදී අනාවරණය විය. කෙසේ වුවද, භූගත ජලයේ ගුණාත්මකභාවයේ වෙනස්වීම පිළිබඳ නිගමනය කිරීම සඳහා ජල නියැදීන් ලබා ගැනීම (මෝසම් වර්ෂා කාලයට පෙර සහ පසු වශයෙන්) සහ විශ්ලේෂණය කිරීම සිදු කළ යුතුය. එබැවින්, පර්යේෂණ නල ළිං වල භූගත ජලයේ විද්‍යුත් සන්නායකතාවය, සනත්වය, ෆ්ලෝරයිඩ් ප්‍රමාණය, ක්ලෝරයිඩ් ප්‍රමාණය සහ pH අගය ඉදිරි වසර 05කකාලය තුල විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය වේ.

## 1.2 කිරිදි ඔය ජල ද්‍රෝණියේ භූගත ජලයපිළිබඳ ඇගයීමේ අධ්‍යයනය (රු. මිලියන 1.6)

කිරිදි ඔය ජල ද්‍රෝණියේ භූගත ජලයේ පවතින ගුණාත්මකභාවය හා ප්‍රමාණාත්මකතාවය අධ්‍යයනය කිරීම සඳහා භූගත ජල නිමාන ජාලයක් ස්ථාපිත කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේ දී පහත සඳහන් කාර්යයන් සිදු කර ඇත.

*වගුව 07 : කිරිදි ඔය ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද කාර්යයන්*

| අනු අංකය | කාර්යය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම | 10 |
| 02 | පර්යේෂණ නල ළිං ඉදිකිරීම | 10 |
| 03 | ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම | 10 |
| 04 | සම්මත මිම්මකට අනුව ළිංවල ජල මට්ටම් නිර්ණය කිරීම | 35 |
| 05 | ජල නියැදීන් ලබා ගැනීම සහ දත්ත නිමාන කටයුතු සිදු කිරීම | 200 |
| 06 | ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම | 100 |

පර්යේෂණ නල ළිං වලින් ලබාගත් ජල නියැදීන් විශ්ලේෂණය කිරීමෙන් ලබාගත් ප්‍රතිඵල අනුව, භූගත ජලය ප්‍රධාන වශයෙන් පැළුම් සහිත ජල ධර වලින් ලැබෙන බවත් ජලයේ ගුණාත්මකභාවය අනුව පානය සඳහා සුදුසු බවත් පෙනී ගොස් ඇත. කාළගුණික වෙනස්වීම් මෙන්ම අනෙකුත් ස්වභාවික හේතූන් මත භූගත ජලයේ වෙනස්වීම් හඳුනා ගැනීම පිණිස ඉදිරි වර්ෂ 05ක කාලය තුල මෙම ප්‍රදේශයේ භූගත ජලයේ ගුණාත්මකභාවය නිමානය කිරීම සහ ජල මට්ටම් නිරීක්ෂණය කිරීම ඉතා වැදගත් වේ.

### 2.1.6 ගැඹුරු නල ළිං ඉදිකිරීම, පොම්ප සවිකිරීම සහ ජල පෙරණ සවිකිරීම මගින් වියළි කලාපීය දිස්ත්‍රික්කවල හදිසි ආපදා අවශ්‍යතා සඳහා භූගත ජල සම්පත් සංවර්ධනය කිරීම. (රු. මිලියන 4.6)

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුල ජල හිඟයෙන් පීඩා විඳින ග්‍රාමීය ජනතාවට පිරිසිදු හා ආරක්ෂිත පානීය ජලය ලබා දීම වේ. මේ යටතේ මොණරාගල, කුරුණෑගල, පුත්තලම, මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පහත සඳහන් ක්‍රියාකාරකම් 2017 වර්ෂයේදී සිදු කරන ලදී.

*වගුව 08 : ගැඹුරු නල ළිං ඉදිකිරීම, පොම්ප සවිකිරීම සහ ජල පෙරණ සවිකිරීම මගින් වියළි කලාපීය දිස්ත්‍රික්කවල හදිසි ආපදා අවශ්‍යතා සඳහා භූගත ජල සම්පත් සංවර්ධනය කිරීම යටතේ සිදු කරන ලද කාර්යයන්*

| අනු අංකය | කාර්යය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම | 15 |
| 02 | පර්යේෂණ නල ළිං ඉදිකිරීම | 15 |
| 03 | ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම | 05 |
| 04 | ජලයේ ගිල්වන පොම්ප සවි කිරීම | 05 |
| 06 | ආශුැති ප්‍රතිවර්තක ජල පෙරණ සවි කිරීම | 05 |

ඉහත සඳහන් ළිං ඉදිකරන ලද්දේ ජලය ඉතා අඩු ප්‍රදේශවල වන අතර භූගත ජලයෙ ප්‍රමාණාත්මකතාවය සහ ගුණාත්මකභාවය පානයට ගැනීමට සුදුසු මට්ටමේ පවතී.

### 2.1.7 වියළි කලාපයේ අත් පොම්ප නල ළිං පුනරුත්තාපනය කිරීම (රු. මිලියන 2.3)

බදුල්ල, මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ග්‍රාමීය ප්‍රදේශ වල ජනතාව සඳහා ආරක්ෂිත හා පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර 2017 වර්ෂයේ දී පහත දැක්වෙන කාර්යයන් සිදු කරන ලදී.

*වගුව 09 : වියළි කලාපයේ අත් පොම්ප නල ළිං පුනරුත්තාපනය කිරීමේ වැඩසටහන යටතේ පුනරුත්තාපනය කරන ලද නල ළිං පිළිබඳ විස්තර*

| අනු අංකය | කාර්යය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | පැරණි නල ළිං පිරිසිදු කිරීම | 25 |
| 02 | පැරණි අත් පොම්ප ප්‍රතිසංස්කරණය කිරීම | 50 |
| 04 | අත් පොම්ප සවි කිරීම | 20 |



*රූපසටහන 03 : අත් පොම්පයක් ප්‍රතිසංස්කරණය කිරීම*

### 2.1.8 අදාල අනෙකුත් රාජ්‍ය ආයතන සමග ඒකාබද්ධව භූගත ජල සම්පත් ක්ෂය වීම සහ දූෂණය වීම ආශ්‍රිත පාරිසරික ගැටළු පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම(රු. මිලියන 0.5)

පස්, බොරළු, මැටි, වැලි කැණීම හා ගල් කැඩීම නිසාත්, භූගත ජලය අධික ලෙස ළිං වලින් පොම්ප කිරීම නිසාත් ඇතිවන භූගත ජල මට්ටම්වල අඩුවීම හා ජල දූෂණය යන පාරිසරික වෙනස්වීම් අධ්‍යයනය මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.මධ්‍යම පරිසර අධිකාරිය, හා අනෙකුත් අදාල ආයතනයන් හා මනා සම්බන්ධීකරණය සහිතව මෙම අධ්‍යයන හා නිරීක්ෂණ සිදු කරන ලදී. මේ යටතේ මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යංශය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සහ අනෙකුත් අදාල අධිකාරීන්වල නිලධාරීන්ගේ සහභාගීත්වය ඇතිව කොළඹ, ගම්පහ, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුරය, මොණරාගල, කෑගල්ල හා කළුතර දිස්ත්‍රික්කවල සමීක්ෂණ කටයුතු 100ක් 2017 වර්ෂයේ දී සිදු කරන ලදී.

## 2.1 අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක භූගත ජල සංවර්ධන ව්‍යාපෘති

වගුව 10 : අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක භූගත ජල සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කිරීමේ වගකීම |
|---|---|---|
| 01 | යාපනය අර්ධද්වීපය සඳහා භූගත ජල කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම (රු. මිලියන3.6) | යාපනය පළාත් කාර්යාලය |
| 02 | වාරිමාර්ග යෝජනා ක්‍රම ආශ්‍රිත ප්‍රදේශවල නොගැඹුරු භූගත ජලධර වල භූගත ජල මට්ටම් වෙනස්වීම හා ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ අධ්‍යයනය (රු.මිලියන 1.0) | අනුරාධපුරය පළාත් කාර්යාලය |
| 03 | වියළි කලාපීය ප්‍රදේශවල භූගත ජල සංවර්ධනය (රු. මිලියන 15.0) | ප්‍රධාන කාර්යාලය, කොළඹ |

### 2.2.1 යාපනය දිස්ත්‍රික්කයේ භූගත ජල කළමනාකරණ සැලැස්ම සකස් කිරීම (රු.මිලියන 3.6)

යාපනය අර්ධද්වීපයේ භූගත ජල සංවර්ධනය වඩාත් විද්‍යාත්මකව සිදු කළ යුතු වේ. එමනිසා ජල සම්පත් මණ්ඩලය මගින් යාපනය අර්ධද්වීපයේ භූගත ජල කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ අරමුණ ඇතිව, අර්ධද්වීපයේ භූගත ජල විභවයන් පිළිබඳ තක්සේරු කිරීම සඳහා, භූගත ජල අධ්‍යයනයක් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩමුළු 05ක් යාපනය දිස්ත්‍රික් ලේකම්, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් හා අනෙකුත් අදාල ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වය ඇතිව පැවැත්විණි. මෙම අධ්‍යයනය සඳහා *GPS* 80ක් සහ විද්‍යුත් සන්නායකතාවය මනින මීටර් (*EC Meter*) 80 ක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.තවද, යාපනය දිස්ත්‍රික්කයේ ළිං වල තාක්ෂණික දත්ත ලැයිස්තුවක් සකස් කිරීම සඳහා ළිංවල දත්ත 2018 වර්ෂයේදී එක්රැස් කිරීමට ද බලාපොරොත්තු වේ.

යාපනය දිස්ත්‍රික්කය සඳහා භූගත ජල කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමේ අරමුණ ඇතිව ක්‍රමවත් විද්‍යාත්මක භූජල අධ්‍යයනයක් ජල සම්පත් මණ්ඩලය මගින් ආරම්භ කරන ලදී. එසේම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට යෝජිත යාපනය දිස්ත්‍රික්කයේ පිහිටි ළිංවල ලැයිස්තුවක් සකස් කිරීමට අදාල වන අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත 2018 වසරේදී ලබා ගැනීමට අපේක්ෂිතය.




**රූපසටහන 04 : දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම**

### 2.2.2 වාරිමාර්ග යෝජනා ක්‍රම ආශ්‍රිත ප්‍රදේශවල නොගැඹුරු භූගත ජලධර වල ජල මට්ටම් වෙනස්වීම හා ජලයේ ගුණාත්මක භාවය අධ්‍යයනය (රු.මිලියන 1.0)

යාං ඔය හා මල්වතු ඔය වාරිමාර්ග ක්‍රම ආශ්‍රිත ප්‍රදේශවල භූගත ජලයේ ගුණාත්මකභාවය හා ප්‍රමාණාත්මකතාවය වෙනස් වීම අධ්‍යයනය මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

එම ජලාශ අවට ප්‍රදේශයේ ජලයේ ගුණාත්මකභාවය අධ්‍යයනය සහ ජල මට්ටම් නිමානය සඳහා නිමාන ජාලයක් ස්ථාපිත කිරීමේ අරමුණ ඇතිව 2017 වර්ෂයේදී යාං ඔය ජලාශය ආශ්‍රිත ප්‍රදේශයේ පහත දැක්වෙන කාර්යයන් සිදු කරන ලදී.

***වගුව 11 : 2017 වර්ෂයේදී සිදු කරන ලද කාර්යයන්***

| අනු අංකය | කාර්යය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | දත්ත එක්රැස් කිරීම | 100 |
| 02 | භූගත ජල විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම | 25 |
| 03 | නිමාන කටයුතු සඳහා පර්යේෂණ නල ළිං ඉදිකිරීම | 25 |
| 04 | ජල නියැදීන් ලබා ගැනිම සහ විශ්ලේෂණය කිරීම | 13 |

*පර්යේෂණ නල ළිං වල ආධාරයෙන් යාං ඔය ජලාශය ආශ්‍රිත ප්‍රදේශයේ භූගත ජලයේ ගුණාත්මකභාවය හඳුනාගැනීම සඳහා නිමාන ජාලයක් ස්ථාපිත කරන ලදී.*

**2018 වසර සඳහා සැලසුම්**

1. නිමාන ජාලය ස්ථාපිත කිරීම සඳහා අඩුව පවතින දත්ත ලබාගැනීම පිණිස යාන් ඔය ජලාශය පිහිටි ප්‍රදේශයේ පර්යේෂණ නල ළිං 20ක් ඉදිකිරීම.
2. මල්වතු ඔය ජලාශය පිහිටි ප්‍රදේශයේ පර්යෙෂණ නල ළිං 25ක් ඉදි කිරීම.

**2.2.3 වියළි කළාපීය ප්‍රදේශවල භූගත ජලය සංවර්ධනය කිරීම (රු. මිලියන 15.0)**

මෙම ව්‍යාපාතිය යටතේ 2017 වර්ෂයේදී පහත දැක්වෙන කාර්යයන් සිදු කරන ලදී.

**2.2.3.1** *කොළඹ, රත්නපුරය, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ කෑගල්ල දිස්ත්‍රික්කවල ගංවතුරින් හානියට පත් ප්‍රදේශවල ළිං පිරිසිදු කිරීමේ වැඩසටහන* **(***රු. මිලියන* **20.0)**

ගංවතුරින් හානියට පත් ප්‍රදේශවල පානයට ජලය ලබාගන්නා ළිං, ගංවතුර නිසා අපිරිසිදු වී තිබුණු අතර ජල සම්පත් මණ්ඩලය විසින් ළිං පිරිසිදු කිරීමේ වැඩසටහනක් ආරම්භ කර එම ප්‍රදේශවල පීඩාවට පත් ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන් රත්නපුරය, මාතර සහ කළුතර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලදී.

මෙම වැඩසටහන යටතේ පිරිසිදු කරන ලද ළිං පිළිබඳ සාරාංශය පහත සඳහන් පරිදි වේ.

*වගුව 12 : ළිං පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පිරිසිදු කරන ලද ළිංවල විස්තර*

| දිස්ත්‍රිකක්ය | පිරිසිදු කරන ලද ළිං ප්‍රමාණය |
|---|---|
| රත්නපුරය | 490 |
| මාතර | 786 |
| කළුතර | 548 |
| **එකතුව** | **1824** |

ළිං පිරිසිදු කිරීමේ වැඩසටහන මගින් ජල නියැදීන් 784ක pH අගය සහ විද්‍යුත් සන්නායකතාවය සහ බැක්ටීරියා විශ්ලේෂණය කරන ලදී.





*රූපසටහන 05: මාතර දිස්ත්‍රික්කයේ ළිං පිරිසිදු කිරීම රූපසටහන 06 : ක්ෂේත්‍රයේදී ජල නියැදීන් රසායනිකව විශ්ලේෂණය කිරීම*

### *2.2.3.2* නියඟයෙන් පීඩාවට පත් ප්‍රදේශවල ගැඹුරු නල ළිං, වල ළිං ඉදිකිරීම සහ ජල පොම්ප සවි කිරීම

දිවයිනේ වියළි කළාපීය ප්‍රදේශවල ජීවත් වන ජනතාවට පිරිසිදු සහ ආරක්ෂිත පානීය ජලය ලාබදීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. මේ යටතේ 2017 වර්ෂයේදී මොණරාගල, පුත්තලම, අනුරාධපුරය සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

*වගුව 13 : නියඟයෙන් පීඩාවට පත් ප්‍රදේශවල ඉදි කරන ලද නල ළිං පිළිබඳ විස්තර*

| අනු අංකය | කාර්යය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | භූගත ජල සමීක්ෂණ සිදු කිරීම | 35 |
| 02 | ගැඹුරු නල ළිං ඉදිකිරීම | 30 |
| 03 | ජල පොම්ප සවි කිරීම | 15 |

ඊට අමතරව, මෙම ව්‍යාපෘතිය යටතේ පහත දැක්වෙන ජල සම්පාදන ව්‍යාපෘතිවල කටයුතු අවසන් කරන ලදී.

1. ඇතිමලේ, තෝරතුපිටිය කුඩා පරිමාණයේ ජල සම්පාදන ව්‍යාපෘතිය නිම කිරීම
2. මොණරාගල දිස්ත්‍රික්කයේ කුඩා පරිමාණයේ ජල සම්පාදන ව්‍යාපෘති නිම කිරීම
3. මොණරාගල දිස්ත්‍රික්කයේ පල්ලේගම පානීය ජල ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම



*රූපටහන 07 : පල්ලේගම පානීය ජල ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ජල පොම්පාගාරයෙ*

## 2.3 වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය (DSWRPP-AF) යටතේ ශ්‍රී ලංකාවේ තෝරාගත් නියමු කලාප 07 ක ස්ථාපනය කරන ලද භූගත ජල අධීක්ෂණ ජාලය පුළුල් කිරීම.

පසුගිය දශක කිහිපය තුළ විවිධාකාර හේතූන් නිසා භූගත ජල සම්පත් වල භූජල විද්‍යාත්මක හා ජල රසායනික තක්සේරුවක් කර නොමැත. කෙසේ වෙතත් මෙම භූගත ජල සම්පත් වල වර්තමාන තත්වය, එම භූගත ජල සම්පත්වලට එල්ල වී ඇති තර්ජන සහ එම තර්ජනවල බලපෑම අධ්‍යයනය කර භූගත ජල නිමාන ජාලයක් ස්ථාපිත කිරීම, දිගුකාලීනව භූගත ජල සම්පත් කළමනාකරණය සඳහා වැදගත් වේ. මෙම තත්වය යටතේ ජල සම්පත් මණ්ඩලය මගින් හඳුනාගත් පළාත් හතක, දිස්ත්‍රික්ක 07ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ37කභූගත ජල අධීක්ෂණ වැඩසටහන් පිහිටුවීම සම්බන්ධ කටයුතු 2010 වර්ෂයේදී වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ආරම්භ කරන ලදී. වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ අනු ව්‍යාපෘතියක් ලෙස ජල සම්පත් මණ්ඩලයට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලැබී ඇත.

ජලයේ ගුණාත්මකභාවය හා ප්‍රමාණාත්මකතාවය පිළිබඳව ගැටළු වාර්තා වී ඇති යාපනය,අනුරාධපුරය, මාතලේ, පුත්තලම, ගම්පහ සහ අම්පාර යන දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මෙම අධ්‍යයන කටයුතු සිදු කරන ලදී.ප්‍රධාන වශයෙන් අවධානයට ලක් වූ ගැටළු වූයේ විශාල වශයෙන් පොහොර සහ පළිබෝධ නාශක භාවිතය, අධික ලෙස භූගත ජලය උකහා ගැනීම නිසා භූගත ජලයට මුහුදු ජලය මිශ්‍ර වීම,සනීපාරක්ෂක පහසුකම් සතුටුදායක නොවීම සහ ජලයේ පවතින ඉහළ ෆ්ලෝරයිඩ් සාන්ද්‍රණය ආදිය වේ. තවද, කෘෂි ළිං වලින් ජලය අධික ලෙස පොම්ප කරනු ලබන අතර, ඒවායේ ඉදිකිරීම් හා කළමනාකරණය පිළිබඳ සුදුසු නිර්ණායකයක් නොමැති බව අවබෝධ විය. භූගත ජල නිමාන ජාලය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියේදී ඉහත සියලු හේතු පිළිබඳව සැලකිල්ලට ගන්නා ලදී. මේ පිළිබඳව විවිධ අදහස් එක්රැස් කර ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, ජාතික මට්ටමේ වැඩමුළු තුනක් සහ පාසල් මට්ටමේ වැඩසටහන් ද පවත්වන ලදී.




***රූප සටහන 08: ව්‍යාපෘතියේ1 සහ 2 අදියර හා අදියරවල නියමු ප්‍රදේශ සහ අලුතින් තෝරාගත් පොළොන්නරුවේ නියමු ප්‍රදේශය දැක්වෙන සිතියම***

**වගුව 14 : වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය (DSWRPP-AF) යටතේ ශ්‍රීලංකාවේ තෝරාගත් නියමු කලාප 07 ක ස්ථාපනය කරන ලද භූගත ජල අධීක්ෂණ ජාලය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේදී සිදුකරන ලද ක්‍රියාකාරකම්**

| අනු අංකය | නියමු ප්‍රදේශය | දී. කා. ජ. ගු. නි. | | | භූ භෞතික විද්‍යාව | | | | නල ළිං ඉදිකිරීම | | | | ජල ධාරිතා පරීක්ෂණ | | ජල මට්ටම් ලබා ගැනීම | | දීර්ස කරන ලද ප්‍රදේශ | | | | | දැනුවත් කිරීමේ වැඩසටහන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | තෙත් | වියළි | | 1D | | 2D | | | | | | | | | | | | | | | | |
| | | | | | ඉ. | ස. | ඉ. | ස. | ඉ. | ස. | ඉ. | ස. | ඉ. | ස. | ඉ. | ස. | ඉ. | ස. | 1 | 2 | 3 | ඉ. | ස. |
| 1 | අම්පාර | | 27 | 59 | 20 | 20 | 20 | 20 | 10 | 10 | 6 | 0 | 4 | 0 | 50 | 0 | 100 | 121 | 66 | | 55 | 1 | 1 |
| 2 | අනුරාධපුරය | | | 34 | 20 | 17 | අ.නො | අ.නො | 10 | 10 | 6 | 0 | 3 | 0 | 50 | 0 | 100 | 99 | | 98 | 0 | 2 | 1 |
| 3 | මාතලේ | | 39 | 44 | 20 | 15 | අ.නො | | 15 | 7(2) | 6 | 0 | 4 | 0 | 40 | 0 | 50 | 0 | | | | 2 | 1 |
| 4 | පුත්තලම | | | 30 | 30 | 28 | 20 | 10 | 20 | 10(5) | 6 | 0 | 5 | 0 | 50 | 0 | 120 | 56 | | | 56 | 3 | 1 |
| 5 | ගම්පහ | | | 24 | 20 | 0 | 10 | 0 | 10 | 0 | 2 | 0 | 3 | 0 | 40 | 0 | 100 | 87 | | 87 | | 2 | 1 |
| 6 | යාපනය | | 124 | 124 | 30 | 15 | 20 | 0 | 15 | 15 | 6 | 0 | 5 | 5 | 50 | 0 | 140 | 156 | | 128 | | 3 | 1 |
| 7 | කල්පිටිය | | | 15 | 20 | 20 | අ.නො | අ.නො | 15 | 15 | අ.නො. | අ.නො. | අ.නො. | අ.නො. | අ.නො. | අ.නො. | අ.නො. | අ.නො. | අ.නො. | අ.නො. | අ.නො. | 0 | 0 |
| 8 | පොළොන්නරුව | | | | 100 | 100 | අ.නො | අ.නො | 21 | 0(3) | අ.නො. | අ.නො. | 21 | 0 | 50 | 0 | 200 | 125 | 55 | 20 | | 3 | 1 |
| 9 | බදුල්ල | | | 33 | 20 | 12 | අ.නො | අ.නො | 20 | 17 | අ.නො. | අ.නො. | අ.නො. | අ.නො. | 50 | 0 | 50 | 72 | | 46 | 26 | 1 | 1 |
| | එකතුව | | | 363 | 280 | 227 | 70 | 30 | 136 | 81 | 32 | 0 | 45 | 5 | 380 | 0 | 860 | 716 | 121 | 379 | 137 | 17 | 8 |

**ඉ.-ඉලක්කය** **ස. - සම්පූර්ණ කරන ලද** **දී.කා. ජ. ගු. නි. - දීර්ඝ කාලීන ජලයේ ගුණාත්මකභාවය නිරීක්ෂණය**

**1 - විශ්ලේෂණය සිදු කරමින්පවතී** **2 - විශ්ලේෂණය සිදු කරඅවසන් කර ඇත** **3 - විශ්ලේෂණය නොකරන ලදී** **අ. නො. - අදාල නොවේ**

මේ යටතේ එක් එක් නියමු ප්‍රදේශයේ හඳුනාගත් ගැටළු පිළිබඳව වෙන් වෙන්ව සලකා බලන ලදී. මාතලේ දිස්ත්‍රික්කයේ ජල රසායනය පිළිබඳව හැරුණු කොට අධික ලෙස භූගත ජලය උකහා ගැනීම නිසා භූගත ජලයට බලපෑම් සිදු වී ඇති ප්‍රදේශ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලදී. මෙම ඇගයීම්වල දී ප්‍රධාන ලෙස i) වර්තමාන තත්වය පිළිබඳව ජනතාව සහ අදාල පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම. ii) භූගත ජල ගැලීම් රටාව හඳුනාගැනීම සහ iii) වියළි සහ තෙත් කාලගුණයන් යටතේ නොගැඹුරු සහ ගැඹුරු ජල ධර වල වෙනස් වීම විශ්ලේෂණය කිරීම ආදිය සිදු කරන ලදී. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ක්ෂේත්‍ර අධ්‍යයන, මූලික සිතියම් සකස් කිරීම, ජල සාම්පල ලබා ගැනීම, භූගත ජල මට්ටම් අධීක්ෂණය, ජලයේ ගුණාත්මකභාවය අධ්‍යයනය කිරීම, 1-D හා 2-D භූ භෞතික සමීක්ෂණ සිදු කිරීම, භූ භෞතික විද්‍යා සමීක්ෂණ සිදු කිරීම, පරීක්ෂණ නල ළිං ඉදිකිරීම, ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම, ජල සාම්පල විශ්ලේෂණය (භෞතික, රසායනික, බැර ලෝහ, ක්ෂුද්‍ර ජීවී සහ කෘමිනාශක), අධීක්ෂණ මධ්‍යස්ථානවල භූගත ජල මට්ටම් මැනීම, ප්‍රතිඵල විශ්ලේෂණය සහ සිතියම් සකස් කිරීම අදිය මෙහි ක්‍රමවේදයට අයත් වේ. මෙම ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයන් මත පදනම්ව සෑම නියමු කලාපයක් සඳහාම අධීක්ෂණ ජාලයක් ස්ථාපිත කිරීම සිදුකරන ලදී.

ඉහත රූපසටහන මගින් පළමුව තෝරාගත් නියමු ප්‍රදේශ සහ පසුව එක්කරන ලද පොළොන්නරුව නියමු ප්‍රදේශය පෙන්නුම් කර ඇත.2017 වර්ෂයේ දී සිදු කරන ලද කාර්යයන්ගේ ප්‍රගතිය ඉහත වගුව මගින් දක්වා ඇත.

## 3. මහජනතාවගෙන්, රාජ්‍ය ආයතනවලින් සහ අනෙකුත් ආයතනවලින් ලද ඉල්ලීම් මත භූගත ජල සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම

දිවයිනේ සීඝ්‍ර සංවර්ධනය සමග සිදු වන භූගත ජලය වැඩිමනත් උකහා ගැනීම, භූගත ජල මට්ටම් විචලනය වීම සහ භූගත ජලයේ ගුණාත්මකතාවය අඩු වීම ආදිය හේතුවෙන් වර්තමානයේ ඇතිවී ඇති පාරිසරික ගැටළු සම්බන්ධයෙන් විසඳුම් ලබාදීමට ජල සම්පත් මණ්ඩලයට සෘජුවම වගකීම පවතී. පානීය අවශ්‍යතා, ගෘහස්ථ පරිභෝජන අවශ්‍යතා, කෘෂිකර්මාන්තය සහ කාර්මික කටයුතු සඳහා ජලය ලබාගත හැකි ජල ප්‍රභවයන් හඳුන්වා දීම මෙන්ම, භූගත ජලයට සම්බන්ධ ගැටළු අවම කිරීමේ අරමුණ සහිතව කළුගල් කැණීම්, වැලි කැණීම්, පස් කැපීම් ආදියට අදාල මූලික පාරිසරික සමීක්ෂණ කටයුතුවලට ජල සම්පත් මණ්ඩලයේ නිලධාරීන් සහභාගී වන ලදී.
මේ යටතේ වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති පහත දැක්වේ.

**වගුව 15 : මහජනතාවගෙන්, රාජ්‍ය ආයතනවලින් සහ අනෙකුත් ආයතනවලින් ලද ඉල්ලීම් මත භූගත ජල සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම යටතේ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති**

| අනු අංකය | ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම |
|---|---|---|
| 01 | චුන්නාකම් ප්‍රදේශයේ භූගත ජලය දූෂණය වීම සම්බන්ධ භූජල විද්‍යාත්මක අධ්‍යයනය | ප්‍රධාන කාර්යාලය, කොළඹ |
| 02 | යාපනය නගර සීමාව ආවරණය වන පරිදි පොකුණු ප්‍රතිසංස්කරණය කිරීම | ප්‍රධාන කාර්යාලය, කොළඹ |
| 03 | මොරගහකන්ද සහ කළුගඟ නැවත පදංචිකරන ලද ප්‍රදේශවල නල ළිං ඉදි කිරීම | ප්‍රධාන කාර්යාලය, කොළඹ |
| 04 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් උතුරු පළාතේ නැවත පදිංචි කිරීම සම්බන්ධ කාර්ය බලකාය යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ නල ළිං ඉදිකිරීම | ප්‍රධාන කාර්යාලය, කොළඹ |
| 05 | කිළිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කවල ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම සහ නිෂ්පාදන නල ළිං ඉදිකිරීම -WASSIP (නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය) | ප්‍රධාන කාර්යාලය, කොළඹ |

## 4. වාණිජමය කටයුතු

ඊට අමතරව ජනතාවගෙන්, රාජ්‍ය ආයතනවලින් සහ අනෙකුත් ආයතනවලින් ලැබුණු ඉල්ලීම් අනුව පහත දැක්වෙන වාණිජමය කටයුතු 2017 වසරේදී සිදු කරන ලදී.

*වගුව 16 : වර්ෂය තුල සිදු කරන ලද වාණිජමය කාර්යයන් පිළිබඳ විස්තර*

| අනු අංකය | ක්‍රියාකාරකම් | ප්‍රමාණය |
|---|---|---|
| 1 | භූ විද්‍යා සමීක්ෂණ සිදු කිරීම | 659 |
| 2 | නල ළිං ඉදි කිරීම | 166 |
| 3 | අත් පොම්ප සවි කිරීම | 32 |
| 4 | ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම | 215 |
| 5 | නල ළිං පිරිසිදු කිරීම | 36 |
| 6 | ජල සාම්පල රසායනික විශ්ලේෂණය | 756 |
| 8 | යකඩ පෙරණ සවි කිරීම | 34 |

## 5. ජල සම්පත් මණ්ඩලය විසින්සිදු කරන ලද අනෙකුත් ක්‍රියාකාරකම්

### ලෝක ජල දින සැමරුම් වැඩසටහන

2017 මාර්තු මස 22 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී " ශ්‍රී ලංකාවේ ජල සම්පත් තිරසාර ලෙස ආරක්ෂා කිරීම හා සංරක්ෂණය" යන තේමාව යටතේ ජල සම්පත් මණ්ඩලය විසින් ලෝක ජල දිනය සමරනු ලැබීය. වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යගරු. ගාමිණී විජිත් විජයමුණි සොයිසා මැතිතුමා මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා විය. අනුරාධපුරය, අම්පාර, පොළොන්නරුව, මොණරාගල දිස්ත්‍රික්කවල පාසල් ළමුන් 135 දෙනෙකු පමණ මෙම අවස්ථාවට සහභාගී වූහ. මෙම උත්සවයට සමගාමීව "ජල සංරක්ෂණය" නමින් පාසල් ළමුන්ගේ චිත්‍ර ප්‍රදර්ශනයක් ද පවත්වන ලදී. එසේම, සහභාගී වූ පාසල් ළමුන් සඳහා පාසැල් බෑග් සහ චිත්‍ර ප්‍රදර්ශනයේ ජයග්‍රාහකයින්ට විශේෂ ත්‍යාගද ලබා දෙන ලදී.



*රූපසටහන 09 : සහතික පත්‍ර සහ බෑග් බෙදා දීම*



*රූපසටහන 10 : පාසැල් ළමුන්ගේ චිත්‍ර ප්‍රදර්ශනය*

## අනුරාධපුර පළාත් කාර්යාලය මගින් සිදු කරන ලද කාර්යයන්

### 1 වාණිජමය කටයුතු

මහජනතාවගෙන්, රාජ්‍ය සහ පුද්ගලික ආයතනවලින් ලද ඉල්ලීම් මත ගෘහස්ථ, කෘෂිකාර්මික සහ කාර්මික කටයුතු සඳහා ජල අවශ්‍යතා සපුරාලීම පිණිස අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල, මාතලේ, මඩකලපුව, මුලතිව්, මන්නාරම සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල 2017 වර්ෂයේදී පහත දැක්වෙන කාර්යයන් සිදු කරන ලදී.

*වගුව 17 : 2017 වර්ෂයේදී සිදුකරන ලද කාර්යයන්*

| අනු අංකය | කාර්යය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම | 124 |
| 02 | ගැඹුරු නල ළිං ඉදිකිරීම | 67 |
| 03 | ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම | 17 |
| 04 | අත් පොම්ප සවි කිරීම | 13 |
| 05 | නල ළිං පිරිසිදු කිරීම | 01 |
| 06 | ජල සාම්පල විශ්ලේෂණය කිරීම | 84 |
| 07 | සංචාරක බංගලාවේ නවාතින් ගැනීම | |
| 08 | පුහුණු මධ්‍යස්ථානයේ නවාතැන් ගැනීම | |

1.1. පානීය ජලය ලබා දෙන ප්‍රජා ජල සංවිධාන සඳහා භූගත ජලය සැපයීමට හැකි භූගත ජලය වැඩිමනත් පවතින ප්‍රදේශ හඳුනාගැනීම පිණිස අනුරාධපුරය දිස්ත්‍රික්කයේ පහළ මාරගහවැව, රත්මල්ගහවැව, නැකැත්තේගම, ජයගම, තලාව, තඹුත්තේගම, ගෙතලාව සහ කිරිදිවත්ත ප්‍රදේශවල භූජල විද්‍යාත්මක අධ්‍යයන සිදු කරන ලදී.

1.2. අනුරාධපුරය, මාතලේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල රාජ්‍ය සහ පුද්ගලික ආයතනවල පානීය ජල අවශ්‍යතා සහ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය සැපයීම ට හැකි භූගත ජලය වැඩිමනත් පවතින ගැඹුරු ජල ධර පිහිටි පුදේශ හඳුනාගැනීම පිණිස භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කරන ලදී.

1.3 බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් උතුරු පළාතේ නැවත පදිංචි කිරීම සම්බන්ධ කාර්ය බලකාය යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පලෙයිකුලි, මරිච්චිකඩි, මුල්ලිකුලම්, කොන්ඩච්චි ප්‍රදේශවල ගැඹුරු නල ළිං ඉදිකිරීම. මෙම ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේදී භූජල විද්‍යාත්මක සමීක්ෂණ 31ක් සිදු කරන ලද අතර නිෂ්පදන නල ළිං 19ක් ඉදිකරන ලදී.



*රූපසටහන 11 මන්නරාම දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පලෙයිකුලි ග්‍රාමයේ භූජල සමීක්ෂණයක් සිදු කරන අයුරු*

1.4 වැලි සහ පස් කැණීම මෙන්ම ගල් කැඩීම නිසා පරිසරයට සිදුවන බලපෑම පිළිබඳව තක්සේරු කිරීම පිණිස අදාල ස්ථානවල භූජල විද්‍යාත්මක සහ භූ භෞතික සමීක්ෂණ ද ජල ධාරිතා පරීක්ෂණ ද සිදු කරන ලද අතර එම පරීක්ෂණවල ප්‍රතිඵල මත පදනම් ව භූගත ජල සම්පත් වලට වන හානිය අවම වන පරිදි මෙම කැණීම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය මගපෙන්වීම් සහ නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී. මෙම සමීක්ෂණ වාර්තා මාතලේ, අනුරාධපුරය සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල කහටගස්දිගිලිය, කැබිතිගොල්ලෑව, මැදවච්චිය, බුලගල, මතාව, පලාගල සහ රිදීගම ප්‍රදේශවල මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල, ප්‍රාදේශීය සභා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය සහ අනෙකුත් අදාල ආයතන වෙත යොමු කරන ලදී.



*රූපසටහන 12 : ගල් කඩන ස්ථානයක භූජල සමීක්ෂණයක් සිදුකරන ආකාරය*

1.5 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කජුවත්ත සහ ගෝමරන්කඩවල නැවත පදිංචි කරන ලද ප්‍රදේශවලට අවශ්‍ය පානීය ජලය සැපයීම සඳහා යාංඔය ජලාශය ව්‍යාපෘතිය යටතේ අත් පොම්ප සවිකල නල ළිං 05ක් ඉදිකිරීමේ අරමුණ සහිතව එම ප්‍රදේශවල ගැඹුරු ජල ධරයේ තිබෙන භූගත ජලය අධික ලෙස පවතින ස්ථාන හඳුනා ගැනීම පිණිස සවිස්තරාත්මක භූජල අධ්‍යයනයන් 05ක් සිදු කරන ලදී.

1.6 අනුරාධපුරය දිස්ත්‍රික්කයේ ඌරාව සහ ඕමරකඩ නැවත පදිංචි කරන ලද ප්‍රදේශවලට අවශ්‍ය පානීය ජලය සැපයීම සඳහා යාංඔය ජලාශය ව්‍යාපෘතිය යටතේ අත් පොම්ප සවිකල නල ළිං 16ක් ඉදිකිරීමේ අරමුණ සහිතව එම ප්‍රදේශවල ගැඹුරු ජල ධරයේ තිබෙන භූගත ජලය අධික ලෙස පවතින ස්ථාන හඳුනා ගැනීම පිණිස සවිස්තරාත්මක භූජල අධ්‍යයනයන් 16ක් සිදු කරන ලදී.

1.7 පාරිභෝගිකයන් වෙත පිරිසිදු හා ආරක්ෂිත භූගත ජලය වැඩි ප්‍රමාණයක් ලබා දීමේ අරමුණ සහිතව අනුරාධපුරය දිස්ත්‍රික්කයේ ඔත්තප්පුව ප්‍රදේශයේ ප්‍රජා ජල ව්‍යාපෘතියකට අයත් ගැඹුරු නල ළිඳ පිරිසිදු කරන ලදී.



*රූපසටහන **13 :** ප්‍රජා ජල ව්‍යාපෘතියට අයත් නල ළිඳේ ජල ධාරිතා පරීක්ෂණයක් සිදු කරන ආකාරය*

1.8 පළාත් කාර්යාලයට අනුබද්ධ රසායානාගාරය මගින් විවිධ පුද්ගලයින්, ව්‍යපෘති, ප්‍රජා මූල සංවිධානය සහ ආයතන විසින් ලබා ගන්නා ලද ජල නියැදීන් 84ක් 2017 වර්ෂය තුලදී විශ්ලේෂණය කරන ලදී.

2. අනෙකුත් කාර්යයන්

වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය යටතේ අනුරාධපුරය පළාත් කාර්යාලය සඳහා සියලු උපාංග සහිත නව රසායනාගරයක් ඉදිකරන ලද අතර එම විද්‍යාගාරය තුල පසෙහි සහ ජලයෙහි පවතින පලිබෝධනාශක සහ බැර ලෝහ විශ්ලේෂණය කිරීමේ පහසුකම් සහිතය.



*රූපසටහන **14 :** අනුරධපුරය පළාත් කාර්යාලයේ අළුතෙන් ඉදිකරන ලද විද්‍යාගාරය*

## පුත්තලම පළාත් කාර්යාලය මගින් සිදු කරන ලද කාර්යයන්

1 **වාණිජමය කටයුතු**

1.1 පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ප්‍රජා ජල සංවිධාන, කුඩා පරිමාණයේ ජල යෝජනා ක්‍රම (ප්‍රජා මූල) සහ පුද්ගලික සහ රාජ්‍ය අංශයන් සඳහා සවිස්තරාත්මක භූජල විද්‍යාත්මක අධ්‍යයන, නල ළිං ඉදිකිරීම්, ජල ධාරිතා පරීක්ෂණ සහ ජල නියැඳීන් විශ්ලේෂණය සිදු කරන ලදී.

1.2 වැලි සහ පස් කැණීම මෙන්ම ගල් කැඩීම නිසා පරිසරයට සිදුවන බලපෑම පිළිබඳව තක්සේරු කිරීම පිණිස අදාල ස්ථානවල භූජල විද්‍යාත්මක සහ භූ භෞතික සමීක්ෂණ ද ජල ධාරිතා පරීක්ෂණ ද සිදු කරන ලද අතර එම පරීක්ෂණවල ප්‍රතිඵල මත පදනම් ව භූගත ජල සම්පත් වලට වන හානිය අවම වන පරිදි මෙම කැණීම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය මගපෙන්වීම් සහ නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී. අදාල වාර්තා භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය, මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල, සහ පළාත් පාරිසරික අධිකාරි වෙත යොමු කරන ලදී.

*වගුව 18 : පුත්තලම පළාත් කාර්යාලය විසින් 2017 වර්ෂය තුලදී සිදු කරන ලද කාර්යයන්*

| අනු අංකය | මාසය | භූජල සමීක්ෂණ සිදු කිරීම | නල ළිං ඉදිකිරීම | ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම | ළිං පිරිසිදු කිරීම | ජල නියැඳීන් විශ්ලේෂණය කිරීම | අත් පොම්ප සවි කිරීම |
|---|---|---|---|---|---|---|---|
| 01 | ජනවාරි | 07 | 02 | 05 | 01 | 11 | - |
| 02 | පෙබරවාරි | 09 | 01 | 04 | 00 | 13 | - |
| 03 | මාර්ත | 13 | 01 | 04 | 02 | 05 | - |
| 04 | අප්‍රේල් | 05 | 00 | 00 | 00 | 03 | |
| 05 | මැයි | 12 | 00 | 01 | 00 | 08 | - |
| 06 | ජූනි | 13 | 00 | 03 | 00 | 01 | - |
| 07 | ජූලි | 12 | 00 | 05 | 00 | 36 | - |
| 08 | අගෝස්තු | 19 | 00 | 01 | 00 | 27 | 01 |
| 09 | සැප්තැම්බර් | 21 | 00 | 07 | 00 | 04 | - |
| 10 | ඔකතෝබර් | 19 | 00 | 09 | 00 | 03 | 01 |
| 11 | නොවැම්බර් | 09 | 01 | 03 | 00 | 03 | 01 |
| 12 | දෙසැම්බර් | 07 | 02 | 03 | 01 | 08 | - |
| | **එකතුව** | **146** | **07** | **45** | **04** | **122** | **03** |

## මොණරාගල පළාත් කාර්යාලය මගින් සිදු කරන ලද කාර්යයන්

1. **වාණිජමය කටයුතු**

1.1 මොණරාගල, බදුල්ල, හම්බන්තොට, මාතර සහ අම්පාර දිස්ත්‍රික්කවල පුද්ගලික සහ රාජ්‍ය අංශයේ ඉල්ලීම් පරිදි සවිස්තරාත්මක භූජල සමීක්ෂණ සිදු කිරීම, නල ළිං ඉදිකිරීම, ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම, ජල නියැඳීන් විශ්ලේෂණය කිරීම සිදු කරන ලදී. එම කාර්යයන් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

*වගුව 19 : මොණරාගල පළාත් කාර්යාලය මගින් 2017 වර්ෂය තුලදී සිදු කරන ලද කාර්යයන්*

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | මොණරාගල | 30 |
| 2 | බදුල්ල | 09 |
| 3 | හම්බන්තොට | 11 |
| 4 | මාතර | 07 |
| 5 | අම්පාර | 01 |
| 6 | රත්නපුරය | 02 |

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,743,000 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.27,092,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.20,349,000 ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම රු.59,243,000 කින් වැඩි වී තිබුණ ද වර්ෂයේ පරිපාලන වියදම රු.38,057,000 කින් හා අනෙකුත් ව්‍යාපෘති වියදම් රු.28,121,000 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහකිරීමේ දී 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් දක්නට ලැබුණ ද 2016 සහ 2017 වර්ෂවලදී අතිරික්තයක් දක්නට ලැබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැළපීමෙන් පසු මණ්ඩලයේ දායකත්වය 2013 වර්ෂයේ සිට වර්ධනය වී සමාලෝචිත වර්ෂයේ දී රු.227,278,000 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් 2017 වර්ෂයේ දී ඉටු කළ යුතු සමස්ත කාර්යය ඉටු කර ගැනීමට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඊට අනුරූපීව අයවැය ඇස්තමේන්තුව සහ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වුව ද එ පරිදි කටයුතු කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සහ ප්‍රසම්පාදන සැලැස්ම එකිනෙකට සැසඳිය හැකි ආකාරයට පිළියෙල කර නොතිබුණි.

5

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වාර්තාව මණ්ඩලය පිළියෙල කර තිබුණ ද ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ක්‍රියාකාරකමට අදාල මූල්‍ය කාර්යසාධනය එම වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මඟින් විෂයයන් 08 ක් යටතේ පර්යේෂණ 575 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණ ද ප්‍රගති වාර්තා අනුව මණ්ඩලය විසින් පර්යේෂණ ඒකක 356 ක් පමණක් ඉටු කර තිබුණු අතර ඉටුනොකළ ප්‍රමාණය 219 ක් විය. කාර්යයන් ඉටු නොකළ ප්‍රමාණය සියයට 24 ත් සියයට 100 ත් අතර පරාසයක විය. ඒ සඳහා මණ්ඩලය සතු භූ ජල විද්‍යාඥයින්ගේ හිඟය, රටතුල පැවති හදිසි ආපදා අවස්ථාවලට ඔවුන් යෙදවීමට සිදු වීම, සම්පත් හා තාක්ෂණික කාර්යය මණ්ඩලය සීමාසහිත වීම යන හේතු බලපා තිබුණි.

(ආ) පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු

(i) 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ජලය පිළිබඳ තත්ත්වය සහ එයින් පොදු ජනතාවට වන බලපෑම පරීක්ෂා කිරීම සඳහා රු.133,550,000 ක ඇස්තමේන්තු පිරිවැයට පර්යේෂණ අධ්‍යයන 08 ක් ආරම්භ කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට රු.67,159,000 ක් වැය කර තිබුණි. මෙම පර්යේෂණ අධ්‍යයනවලින් 04 ක් 2017 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණ ද එම පර්යේෂණ අධ්‍යයන 04 ම නියමිත පරිදි නිමකිරීමට නොහැකිවීම නිසා පර්යේෂණ අධ්‍යයනවලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

(ii) පර්යේෂණ අධ්‍යයනයන් සාර්ථකව සම්පූර්ණ කිරීම සඳහා පූර්ණ කාලීනව පර්යේෂණ නිලධාරියෙකු පත් කළ යුතු වුවත් මණ්ඩලය විසින් සියලුම පර්යේෂණ අධ්‍යයනයන් සඳහා පර්යේෂණ නිලධාරී ලෙස මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී පත් කර තිබුණි. ඔහුගේ සාමාන්‍ය රාජකාරීවලට අමතරව පර්යේෂණ අධ්‍යයන සඳහා යොමුවීමට සිදුවී ඇති බැවින් සැලසුම් කරනලද කාලපරිච්ඡේදය තුළ දී පර්යේෂණ අධ්‍යයනයන් නිම කිරීමට නොහැකිවී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට පර්යේෂණ අධ්‍යයනවල ඇස්තමේන්තුගත මුදලින් ලඟා කර ගත් මූල්‍ය ප්‍රගතිය සියයට 15 සිට සියයට 65 දක්වා පරාසයක වූ අතර එම ව්‍යාපෘතිවල කාල ප්‍රමාදය වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා විය. තවද පර්යේෂණ අධ්‍යයන දීර්ඝ කිරීමේ දී එයට හේතු සහ ඇස්තමේන්තු ඉදිරිපත් කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 ජුනි 29 දින උපදේශක කමිටුව රැස්වී තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළදී සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයන 08 ක ප්‍රගති වාර්තා උපදේශක කමිටුවේ උපදෙස් සඳහා යොමු කර නොතිබුණි.

(ආ) වෙනත් රාජ්‍ය ආයතනවලට අයත් වාහන 03 ක් 1981, 2009 සහ 2016 යන වර්ෂවල සිට මණ්ඩලය විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණ ද එම වාහන පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයතුළදී ද කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව තොග අයිතම ඒකක 31 ක අතිරික්තයක් හා ඒකක 134 ක ඌනතාවයක් හඳුනාගෙන තිබුණ ද ගිණුම්වල ගැලපීම් සිදු කර නොතිබුණි.

7

**4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව යන්ත්‍රෝපකරණ සඳහා අමතර කොටස් මිලදී ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.171,516,000 ක් වූ තොගය තුළ රු.76,474,390 ක් සෙමින් චලනය වන, නිකුත් නොවන සහ යල්පැනගිය තොග ඇතුළත් විය.

**4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම**

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, රත්මලාන හා වවුනියා වැඩපල සහ අනුරාධපුර සංචාරක බංගලාව පිහිටි ඉඩම් සහ ගොඩනැගිලි මණ්ඩලය වෙත පවරාගැනීමට කටයුතු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය ආරම්භය වන විට එම ඉඩම්වල රු.6,258,000 ක් වැය කර නව ගොඩනැගිලි ඉදිකිරීම් හා පවතින ගොඩනැගිලි වෙනස් කිරීම් ද මණ්ඩලය විසින් සිදු කර තිබුණි.

**4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයේ කාර්යයභාරය ඉටු කර ගැනීම සඳහා බඳවාගෙන තිබුණු රියදුරකු මණ්ඩලයේ කාර්යයන්ගෙන් බැහැර රේඛීය අමාත්‍යාංශයේ රාජකාරි කටයුතු සඳහා 2017 ජනවාරි 11 දින සිට මුදා හැර තිබුණු අතර රු.145,392 ක වැටුප් හා දීමනා මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ජල සම්පත් මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ජල සම්පත් මණ්ඩලය දැනුවත් වී තිබුණ ද ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්කය ලඟා විය යුතු සංධිස්ථාන මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශක ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජල සම්පත් මණ්ඩලයේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් ලෙස පරිසර අමාත්‍යාංශය, ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන පාර්ශවයන් හඳුනාගෙන තිබුණ ද ආයතනයට අදාල ඉලක්ක පිළියෙල කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපනය නොවන බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ඇ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, භෞතික පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ පුහුණු සේවකයන් නොවීම යන කරුණු හේතු වී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) තිරසාර සංවර්ධන ඉලක්ක කරා ලඟා වීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන වාර්ෂික සංධිස්ථාන හඳුනාගෙන නොතිබුණි.

(ඉ) තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ලඟාවීමට සැලැසුම් සකස් කිරීමේ සහ පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයට අභ්‍යන්තර විගණක ඇතුළු සහායක නිලධාරීන් දෙදෙනෙකු හා විදුම් සහකාරවරයෙක් පත් කර තිබුණි. මේ අනුව තාක්ෂණ හා ඉංජිනේරු ශිල්පක්‍රම භාවිතා කරන මණ්ඩලයේ වැඩ කටයුතු විගණනය කිරීම සඳහා සුදුසුකම්ලත් නිලධාරීන් අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

**6.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

ප්‍රසම්පාදනය සැලැස්මෙහි ඇතුළත් අයිතමයන් කෙරෙහි අවධානය යොමු කිරීමකින් තොරව සැලැස්මෙහි ඇතුළත් නොවූ අයිතමයන් 06 ක් ප්‍රසම්පාදනය කර තිබුණු අතර 2017 අප්‍රේල් 30 දින වන විට ප්‍රසම්පාදනය කිරීමට අපේක්ෂා කරන ලද අයිතමයන් 10 ක් එම දිනයන්හි දී ප්‍රසම්පාදනය කර නොතිබුණි. ඒ අනුව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6.3 අයවැය පාලනය**

අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 12 සිට සියයට 138 දක්වා වූ පරාසයක සහ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 1094 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

**6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2016 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6.5 නොවිසඳී ඇති විගණන ඡේද**

අවුරුදු 06 ක අනිවාර්ය සේවා කාලයකට සහ රු.1,308,699 ක ඇප බැඳුම්කරයකට යටත්ව 2005 වර්ෂයේදී ශිෂ්‍යත්වයකට විදේශගත වූ භූවිද්‍යාඥවරියක ශිෂ්‍යත්වයෙන් පසුව ගිවිසුම්ගත සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර වෙනත් ආයතනයකට මුදාහැර තිබුණි. එම මුදාහැරීම සඳහා ද වර්ෂ 04 ක අනිවාර්ය සේවා කාලයකට සහ රු.435,600 ක ඇප බැඳුම්කරයකට අත්සන් කර තිබුණි. නිලධාරිණිය බැඳී තිබුණු ගිවිසුම් 02 ට අනුකූලව කටයුතු කර නොතිබිය දී 2011 වර්ෂයේ සිට මණ්ඩලයේ සේවයෙන් ස්ථිරව ම මුදාහැර තිබුණ ද ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු රු.1,744,299 ක ඇප මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| 7. (අ) ගිණුම්කරණය | වත්කම් පවරා ගැනීමට කටයුතු නොකිරීම හා ආදායම් හා වියදම් නිසි පරිදි ගිණුම්ගත නොකිරීම. |
| (ආ) කාර්යසාධනය | අපේක්ෂිත පරිදි මූල්‍ය හා භෞතික කාර්යසාධනය ළඟා කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් | නිරවුල් කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඈ) පර්යේෂණ කටයුතු | සැලසුම්කළ පරිදි පර්යේෂණ අධ්‍යයන නිම කිරීමට කටයුතු නොකිරීම. |
| (ඉ) වත්කම් පාලනය | වත්කම් ලේඛනගත කිරීමට කටයුතු නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාව පිළිබඳ අදහස් දැක්වීම

## 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | මහියංගනය අධ්‍යාපන කලාපයේ පාසල් 09 ක නල ළිං ඉදිකිරීමේ භූ විද්‍යා සමීක්ෂණ කටයුතු නිම කර තිබුණ ද ඉන් පාසල් 02 කට අදාළ රු.82,110 ක මුදල පමණක් ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඉතිරි රු.298,252 ක් වූ මුදල ආදායමට නොගෙන ලැබුණු අත්තිකාරම් යටතේ දක්වා තිබුණි. | අනෙකුත් පාසල් 07 ට අදාලව රු.298,252 කට අදාල සේවාවන් 2018 වර්ෂයේ 23.05.2018 දිනැති අංක 15886 දරණ ඉන්වොයිසිය මඟින් ආදායමට ගිණුම් ගත කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සේවකයින් දෙදෙනෙකු වෙනුවෙන් රු.29,721 ක පාරිතෝෂිත වැඩියෙන් වෙන් කර තිබුණි. | පාරිතෝෂිත වෙන් කිරීම ගණනය කිරීමේදි දෙදෙනෙකුගෙන් සේවා කාලය එක් වසරක් වැඩියෙන් ගණනය වී තිබෙන අතර, එම දෝෂය 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදි නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | එකම ගණුදෙනුව සඳහා ඉන්වොයිස්පත් දෙකක් නිකුත් කිරීම හේතුවෙන් රු.44,677 කින් ලැබුණු සේවා අත්තිකාරම අඩුවෙන් සහ ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | බ/ගලනිග විද්‍යාලයේ සිදු කරන ලද භූජල විද්‍යා සමීක්ෂණ කටයුතු සඳහා වැරදීමකින් ඉන්වොයිස්පත් 2 ක් නිකුත් කර ඇත. ගලනිග විද්‍යාලය සඳහා දෙවරක් ඉන්වොයිස් කරන ලද රු.44,677.50 ක මුදල මෙම රු.172,500.00 ක මුදල් ප්‍රමාණයෙන් අඩුකර ඉතිරි මුදල වන රු.127,822.50 ඉන්වොයිස් කිරීමට කටයුතු යොදනු ලැබේ. |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති ශේෂ වටිනාකම වූ රු.18,849,408 කින් රු. 3,178,291 ක් වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ වූ අතර, මොරගහකන්ද ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.860,800 ක් වූ ණයගැති ශේෂය 2015 දෙසැම්බර් 31 දින සිට අය නොවී පැවැතුණි. | 2018.03.28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය අනුව(පත්‍රිකා අංක 1199) හිඟ ශේෂය වූ රු. 860,800/= පොත් වලින් කපා හැරීමට අනුමැතිය ලබා දී ඇති අතර ජනල් වවුචර් අංක JV18 -27 න් 2018 වර්ෂයේ ගිණුම් පොත් වල සටහන් කිරීමට කටයුතු කර ඇත. අනිකුත් ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවති. |
| (ආ) | පුද්ගලයින් සහ ආයතන 214 කින් විවිධ සේවාවන් ඉටු කර දීම සඳහා ලැබුණු රු.82,380,321 ක් වූ සේවා අත්තිකාරම් වලින් රු.2,611,379 ක් වර්ෂයක කාලයක් ඉක්ම වී තිබුණද අදාළ කාර්යයන් ඉටු කර දීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | ප්‍රමාද වී ඇති සේවා අත්තිකාරම් ගිණුම් ශේෂයන් නිරවුල් කිරීමේ කටයුතු සඳහා අවධානය යොමුකර ඇත |

## 2.4 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1964 අංක 29 දරණ ජල සම්පත් මණ්ඩල පනතේ 14 (1) වගන්තිය සහ 1999 අංක 42 දරන සංශෝධිත පනතේ 3 වගන්තිය | සංශෝධිත පනත ප්‍රකාරව 18 දෙනෙකුගෙන් යුක්ත උපදේශක කමිටුවක් පිහිටුවිය යුතු වුවද ඊට පටහැනිව 9 දෙනෙකුගෙන් යුක්ත උපදේශක කමිටුවක් පිහිටුවා තිබුණි. | **2017**වර්ෂයේ පැවති පළමු රැස්වීමට ආයතන නියෝජනය කරමින් නියෝජිතයින් 9 කු සහභාගී වූ අතර2018.02.20 දින පැවති රැස්වීමට නියෝජිතයින් 12 කු සහභාගී විය. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සඳහා වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ පරිගණක ගත කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඒඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.7 ඡේදය | නිලධාරීන් 27 දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ ඔවුන්ගේ වැටුපට අමතරව රු. 1,964,633 ක විශේෂ දීමනාවක් මණ්ඩලය විසින් ගෙවා තිබුණද ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | භාණ්ඩාගාර ලේකම්ගේ අංක 5/ 2017 හා 2017.10.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය මඟින් ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා වෘත්තිය දීමනාවක් වර්ෂ 2017.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවීමට තීරණය කිරීම හේතුවෙන් එතෙක් මණ්ඩලය විසින් අවමය රු.3,000 ක් හා උපරිමය රු.10,000ක් වශයෙන් ගෙවන ලද මාසික දීමනාව අවමය රු.3,000 ක් හා උපරිමය රු. 15,000 ක් වන පරිදි ගෙවීම 2017.10.01 දින සිට මේ දක්වා ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 6,743,000ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 27,092,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.20,349,000 ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම රු.59,243,000 කින් වැඩි වී තිබුණද වර්ෂයේ පරිපාලන වියදම රු. 38,057,000 කින් හා අනෙකුත් ව්‍යාපෘති වියදම් රු. 28,121,000 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ ඌණතාවයක් දක්නට ලැබුණද 2016 සහ 2017 වර්ෂ වලදී අතිරික්තයක් දක්නට ලැබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැළපීමෙන් පසු මණ්ඩලයේ දායකත්වය 2013 වර්ෂයේ සිට වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු. 227,278,000 ක් වී තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් 2017 වර්ෂයේදී ඉටු කළයුතු සමස්ත කාර්යය ඉටුකර ගැනීමට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඊට අනුරූපීව අයවැය ඇස්තමේන්තුව සහ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළයුතු වුවද එ පරිදි කටයුතු කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සහ ප්‍රසම්පාදන සැලැස්ම එකිනෙකට සැසඳිය හැකි ආකාරයට පිළියෙල කර නොතිබුණි. | මේ සම්බන්ධව පවතින අඩුපාඩු මගහරවා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වාර්තාව මණ්ඩලය පිළියෙල කර තිබුණද ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ක්‍රියාකාරකමට අදාළ මූල්‍ය කාර්යසාධනය එම වාර්තවේ ඇතුළත් කර නොතිබුණි. | මේ සම්බන්ධව පවතින අඩුපාඩු මග හරවා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මඟින් විෂයයන් 08 ක් යටතේ පර්යේෂණ 575 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණ ද ප්‍රගති වාර්තා අනුව මණ්ඩලය විසින් පර්යේෂණ ඒකක 356 ක් පමණක් ඉටු කර තිබුණු අතර ඉටුනොකළ ප්‍රමාණය 219 ක් විය. කාර්යයන් ඉටු නොකළ ප්‍රමාණය සියයට 24 ත් සියයට 100 ත් අතර පරාසයක විය. ඒ සඳහා මණ්ඩලය සතු භූ ජල විද්‍යාඥයින්ගේ හිඟය, රටතුල පැවැති හදිසි ආපදා අවස්ථාවලට ඔවුන් යෙදවීමට සිදුවීම, සම්පත් හා තාක්ෂණික කාර්යය මණ්ඩලය සීමාසහිත වීම යන හේතු බලපා තිබුණි. | දිවයිනෙහි පැවැති හදිසි ආපදා තත්වයන්ට භූජල විද්‍යාඥයන් යෙදවීම, පැවැති සම්පත්වල හා තාක්ෂණික කාර්ය මණ්ඩලය සීමාසහිත වීම යන කරුණු මේ සඳහා බලපාන ලදී. |

| (ආ) | **පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු** | |
|---|---|---|
| (i) | 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ජලය පිළිබඳ තත්වය සහ එයින් පොදු ජනතාවට වන බලපෑම පරීක්ෂා කිරීම සඳහා රු. 133,550,000 ක ඇස්තමේන්තු පිරිවැයට පර්යේෂණ අධ්‍යයන 08 ක් ආරම්භ කර තිබුණු අතර, 2017 දෙසැම්බර් 31 දින වන විට රු.67,159,000 ක් වැය කර තිබුණි. මෙම පර්යේෂණ අධ්‍යයනවලින් 04 ක් 2017 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණද එම පර්යේෂණ අධ්‍යයන 04 ම නියමිත පරිදි නිම කිරීමට නොහැකිවීම නිසා පර්යේෂණ අධ්‍යයනවලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | ජල සම්පත් මණ්ඩලයේ උපදේශන කමිටුව 2017 වර්ෂයේදී පිහිටුවීමට කටයුතු යොදන ලද අතර ඉදිරි අධ්‍යයන යෝජනා සහ වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර, පවතින අඩුපාඩු අවම කිරීමට අවධානය යොමු කරනු ලැබේ. |
| (ii) | පර්යේෂණ අධ්‍යයනයන් සාර්ථකව සම්පූර්ණ කිරීම සඳහා පූර්ණ කාලීනව පර්යේෂණ නිලධාරියෙකු පත් කළයුතු වුවත් මණ්ඩලය විසින් සියළුම පර්යේෂණ අධ්‍යනයන් සඳහා පර්යේෂණ නිලධාරී ලෙස මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී පත් කර තිබුණි. ඔහුගේ සාමාන්‍ය රාජකාරීවලට අමතරව පර්යේෂණ අධ්‍යයන සඳහා යොමුවීමට සිදුවී ඇති බැවින් සැලසුම් කරන ලද කාලපරිච්ඡේදය තුළදී පර්යේෂණ අධ්‍යනයන් නිම කිරීමට නොහැකි වී තිබුණි. | අධ්‍යනයන් සාර්ථකව නිම කිරීමට පූර්ණ කාලීන පර්යේෂකයෙකු පත් කිරීම අවශ්‍ය වුවද ඒ සඳහා වර්තමාන සීමිත කාර්ය මණ්ඩලයෙන් නොසැහේ. එසේ වුවද මණ්ඩලය සතු වගකීම් හා ඉදිරි කාර්ය භාරය සැලකිල්ලට ගෙන අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීම් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු යොදනු ලැබේ. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට පර්යේෂණ අධ්‍යයනවල ඇස්තමේන්තුගත මුදලින් ලබා කරගත් මූල්‍ය ප්‍රගතිය සියයට 15 සිට සියයට 65 දක්වා පරාසයක වූ අතර, එම ව්‍යාපෘතිවල කාල ප්‍රමාදය වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා විය. තවද පර්යේෂණ අධ්‍යයන දීර්ඝ කිරීමේ දී එයට හේතු සහ ඇස්තමේන්තු ඉදිරිපත් කර නොතිබුණි. | සීමිත සම්පත් සහ සීමිත තාක්ෂණික කාර්ය මණ්ඩලය යොදවා මෙම අධ්‍යනයන් සිදු කිරීම හේතු කොට අධ්‍යයන කාර්යයන් දීර්ඝ කිරීමට සිදු විය. එසේ වුවද මෙම කරුණු සලකා පර්යේෂණ අධ්‍යයනයන් සැලසුම් කිරීමට ඉදිරියේදී කටයුතු යොදනු ලැබේ. |

## 4.2 <u>කළමනාකරණ ක්‍රියාකාරකම්</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) | 2017 ජූනි 29 දින උපදේශක කමිටුව රැස්වී තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයන 08 ක ප්‍රගති වාර්තාව උපදේශක කමිටුවේ උපදෙස් සඳහා යොමු කර නොතිබුණි. | 2017 ජූනි 29 දින පැවැති රැස්වීමේදී කමිටුව විසින් ඉදිරියේදී සිදුකල යුතු කාර්යයන් සහ ක්‍රියාත්මක විය යුතු ආකාරය ඊළඟ රැස්වීම් වාරයන්හිදී තීරණය කළ යුතු බව දැන්විය. |

| | | |
|---|---|---|
| (ආ) | වෙනත් රාජ්‍ය ආයතනවලට අයත් වාහන 03 ක් 1981,2009 සහ 2016 යන වර්ෂවල සිට මණ්ඩලය විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණද එම වාහන පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයතුළදී ද කටයුතු කර නොතිබුණි. | වෙළි ආරක්ෂණ ව්‍යාපෘතියේ කටයුතු 2018 වර්ෂයේ නිමවීමට ඇති බැවින්, මණ්ඩලයේනමට ඒව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සකස් කිරීමට අපේක්ෂා කෙරේ. |
| (ඇ) | ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව තොග අයිතම ඒකක 31 ක අතිරික්තයක් හා ඒකක 134 ක ඌණතාවයක් හඳුනාගෙන තිබුණද ගිණුම්වල ගැලපීම් සිදු කර නොතිබුණි. | 2017 වර්ෂයේ තොග සමීක්ෂණයන් සිදු කරනු ලබන විට කාර්යාල උපකරණවල ලෙජරය අනුව ශේෂයන් ලෙස දක්වා ඇත්තේ පෙර වර්ෂයේ තොග සමීක්ෂණ අනුව හඳුනාගත් ශේෂයන් වන අතර, ඒ ඒ අංශවල 2017 වර්ෂයේ අවසානයට තිබුණු ශේෂයන් වෙනස්වීම මෙසේ නොසැසඳීමට හේතුව වේ. කාර්යාල උපකරණ වත්කම් පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වූ පසු මෙම තත්වය මඟ හරවා ගත හැකි වෙතැයි අපේක්ෂා කෙරේ. |

## 4.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව යන්ත්‍රෝපකරණ සඳහා අමතර කොටස් මිලදී ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 171,516,000 ක් වූ තොගය තුළ රු.76,474,390 ක් සෙමින් චලනය වන, නිකුත් නොවන සහ යල්පැනගිය තොග ඇතුළත් විය. | වාහන හා යන්ත්‍ර සඳහා යොදා ගැනෙන අමතර කොටස් හා උපාංග මෙම තොග අයිතම තුල ප්‍රමාණාත්මකව පවතින අතර එම යන්ත්‍ර ඉතා පැරණි ඒවා වන හෙයින්ද වෙළඳපලේ නොමැතිකම යන කාරණාවන්ද සැලකිල්ලට ගෙන සෙමින් නිකුත් වන ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් කල නොහැකි තත්වයක පවතී. කෙසේ වුවද අනවශ්‍ය තොග ඉවත් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. |

## 4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, රත්මලාන හා වවුනියා වැඩපල සහ අනුරාධපුර සංචාරක බංගලාව පිහිටි ඉඩම් සහ ගොඩනැගිලි මණ්ඩලය වෙත පවරාගැනීමට කටයුතු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය ආරම්භය වන විට එම ඉඩම්වල රු. 6,258,000 ක් වැය කර නව ගොඩනැගිලි ඉදිකිරීම් හා පවතින ගොඩනැගිලි වෙනස් කිරීම්ද මණ්ඩලය විසින් සිදු කර තිබුණි. | මේ සම්බන්ධව අවධානය යොමු කර ඇත. කෙසේ වෙතත් බදු පදනම මත පරිහරණය කිරීමේ අයිතිය ඒ සඳහා ලබා ගැනීමේ හැකියාව පවතී. |

## 4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයේ කාර්යයභාරය ඉටුකර ගැනීම සඳහා බඳවාගෙන තිබුණු රියදුරකු මණ්ඩලයේ කාර්යයන්ගෙන් බැහැර රේඛීය අමාත්‍යාංශයේ රාජකාරී කටයුතු සඳහා 2017 ජනවාරි 11 දින සිට මුදා හැර තිබුණු අතර රු. 145,392ක වැටුප් හා දීමනා මණ්ඩලය විසින් ගෙවා තිබුණි. | වාරි මාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ දැනුම් දීම පරිදි ජල සම්පත් මණ්ඩලයෙන් වැටුප් ගෙවීමේ පදනම මත අමාත්‍ය කාර්යාලයේ සේවය සඳහා මුදාහැර ඇත. |

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය” ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ජල සම්පත් මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. | |
| (අ) | ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ජල සම්පත් මණ්ඩලය දැනුවත් වී තිබුණද ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්කය ලඟා වියයුතු සංධිස්ථාන මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශක ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූලව ජල සම්පත් මණ්ඩලය විසින් ලඟා කරගත් අරමුණු ප්‍රධාන වශයෙන් භූගත ජල සම්පත් දීප ව්‍යාප්තව සංවර්ධනය කිරීම, සංරක්ෂණය සහ කළමනාකරණය සහතික කිරීම පදනම් වූ අතර, පසුගිය වර්ෂයන්හි මණ්ඩලයේ අත්දැකීම් සහ ඒ සම්බන්ධ ඉලක්ක පාදක දත්ත හා ප්‍රගතිය මැන බැලීමට අදාල අතර මැදි ඉලක්ක මෙන්ම, ප්‍රධාන ප්‍රගති දර්ශක (KPI) ද, මණ්ඩලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් වලට ඇතුළත්කොට ඒ අනුව අදාල ව්‍යාපෘති සිදුකරගෙන යනු ලැබේ. මෙම කටයුතු තවදුරටත් විධිමත් කිරීමට විගණනය මගින් පෙන්වා දී ඇති පරිදි කටයුතු කරනු ලැබේ. |
| (ආ) | තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජල සම්පත් මණ්ඩලයේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් ලෙස පරිසර අමාත්‍යාංශය, ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන පාර්ශවයන් හඳුනාගෙන තිබුණද ආයතනයට අදාළ ඉලක්ක පිළියෙල කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපනය නොවන බව වැඩිදුරටත් | මණ්ඩලයේ කාර්භාරය හා සම්බන්ධ පරිසර අමාත්‍යාංශය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාල පාර්ශවයන් සමඟ මණ්ඩලය නිරතුරුවම කටයුතු කරන අතර, මණ්ඩලයේ කාර්යභාරය සැලසුම් කිරීමේදී විශේෂයෙන්ම වාරිමාර්ග හා ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් ලබාදෙන උපමාණ වලට අනුකූලව කටයුතු යොදනු ලැබේ. |

| | | |
|---|---|---|
| | නිරීක්ෂණය විය. | |
| (ඈ) | කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ලඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, භෞතික පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ පුහුණු සේවකයන් නොවීම යන කරුණු හේතු වී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව දැඩිව අවධානය යොමු කොට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කරනු ලැබේ |
| (ඇ) | තිරසාර සංවර්ධන ඉලක්ක කරා ලඟා වීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන වාර්ෂික සංධිස්ථාන හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා වාර්ෂික සංදිස්ථාන පැහැදිලිව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලෙස මණ්ඩලයේ වාර්ෂික සැලැස්ම තව දුරටත් විධිමත් කිරීමට කටයුතු යොදනු ලැබේ. |
| (ඉ) | තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ලඟාවීමට සැලැසුම් සකස් කිරීමේ සහ පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්වයක පැවැති බව නිරීක්ෂණය විය. | මණ්ඩලයට අවශ්‍ය විද්‍යාත්මක හා තාක්ෂණික කාර්ය මණ්ඩල සහ අනෙකුත් භෞතික හා මූල්‍යමය සම්පත් පුලුල් කොට අපේක්ෂිත තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලීමට අපේක්ෂිතය. |

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | අභ්‍යන්තර විගණන අංශයට අභ්‍යන්තර විගණක ඇතුළු සහායක නිලධාරීන් දෙදෙනෙකු හා විදුම් සහකාරවරයෙක් පත් කර තිබුණි. මේ අනුව තාක්ෂණ හා ඉංජිනේරු ශිල්පක්‍රම භාවිතා කරන මණ්ඩලයේ වැඩ කටයුතු විගණනය කිරීම සඳහා සුදුසුකම්ලත් නිලධාරීන් අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය නොලැබුන අතර ඒ වන විට තනතුර දැරූ අභ්‍යන්තර විගණක සඳහා විගණන සහයක තනතුරක්ද, කළමනාකරණ සහකාර (තාක්ෂණික) තනතුරු 02 ක් සඳහාද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් 2017 දෙසැම්බර් වන විට අනුමැතිය ලැබුණි. |

## 6.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | ප්‍රසම්පාදනය සැලැස්මෙහි ඇතුළත් අයිතමයන් කෙරෙහි අවධානය යොමු කිරිමකින් තොරව සැලැස්මෙහි ඇතුළත් නොවූ අයිතිමයන් 06 ක් ප්‍රසම්පාදනය කර තිබූ අතර 2017 අප්‍රේල් 30 දින වන විට ප්‍රසම්පාදනය කිරීමට අපේක්ෂා කරන ලද අයිතමයන් 10ක් එම දිනයන්හිදී ප්‍රසම්පාදනය කර නොතිබුණි. ඒ අනුව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | වාර්ෂික අයවැය සහ ප්‍රසම්පාදනයන්හි ඇතිවන විචලනයන් හැකි තරම් දුරට අවම කර ගැනීමට ඉදිරියේදී අවධානය යොමු කරනු ලැබේ. |

## 6.3 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 12 සිට සියයට 138 දක්වා වූ පරාසයක සහ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 1094 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | අයවැයගත ආදායම් හා වියදම් සත්‍යගත අගයන් හා අතර ඇතිවන විචලනයන් හැකිතරම් දුරට ඉදිරියේදී අවම කරගැනීම ඉදිරියේදී අවධානය යොමු කර ඇත. |

## 6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | 2016 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2016 වර්තාව මුද්‍රණ කටයුතු සඳහා යොමු කොට ඇත. |

## 6.5 නොවිසඳී ඇති විගණන ඡේද

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | අවුරුදු 06ක අනිවාර්ය සේවා කාලයකට සහ රු.1,308,699 ක ඇප බැඳුම්කරයකට යටත්ව 2005 වර්ෂයේදී ශිෂ්‍යත්වයකට විදේශගත වූ භූවිද්‍යාඥවරියක ශිෂ්‍යත්වයෙන් පසුව ගිවිසුම්ගත සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර වෙනත් ආයතනකට මුදාහැර තිබුණි. එම මුදාහැරීම සඳහා ද වර්ෂ 04ක අනිවාර්ය සේවා කාලයකට සහ රු. 435,000 ක ඇප බැඳුම්කරයකට අත්සන් කර තිබුණි. නිලධාරිණිය බැඳී තිබුණු ගිවිසුම් 02ට අනුකූලව කටයුතු කර නොතිබිය දී 2011 වර්ෂයේ සිට මණ්ඩලයේ සේවයෙන් ස්ථිරවම මුදාහැර තිබුණද ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු රු.1,744,299 ක ඇප මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වනවිට ආපදා කළමණාකරන මධ්‍යස්ථානය වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා ඒකාබද්ධ වී ඇති බැවින් ජල සම්පත් මණ්ඩලය සමග පැවති ඇප බැඳුම්කරය ආපදා කළමණාකරන මධ්‍යස්ථානය වෙත පැවරීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස ලේකම්තුමා වෙත යොමු කර ඇත. |

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | වත්කම් පවරා ගැනීමට කටයුතු නොකිරීම හා ආදායම් හා වියදම් නිසි පරිදි ගිණුම්ගත නොකිරීම | මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර ඇති අංශ වල පවතින අඩුපාඩු මගහරවා ගැනීම සඳහා අවධානය යොමු කරනු ලැබේ. |
| (ආ) | කාර්යසාධනය | අපේක්ෂිත පරිදි මූල්‍ය හා භෞතික කාර්යසාධනය ළඟා කර ගැනීමට කටයුතු නොකිරීම | |
| (ඇ) | ලැබියයුතු සහ ගෙවිය යුතු ගිණුම් | නිරවුල් කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග නොගැනීම | |
| (ඈ) | පර්යේෂණ කටයුතු | සැලසුම්කළ පරිදි පර්යේෂණ අධ්‍යයන නිම කිරීමට කටයුතු නොකිරීම | |
| (ඉ) | වත්කම් පාලනය | වත්කම් ලේඛනගත කිරීමට කටයුතු නොකිරීම | |

# ඇමුණුම්

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2010/23 - 2017 මාර්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2017.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරනු ලැබේ)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

1964 අංක 29 ජල සම්පත් මණ්ඩල පනත

16 වගන්තිය

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගාමිණී විජිත් විජයමුණි සොයිසා වන මා හට 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතෙහි (සංශෝධිත 1999 අංක 42 දරන පනත) 16 වගන්තිය ප්‍රකාරව හිමිව තිබෙන්නාවූ බලතල අනුව ජල සම්පත් මණ්ඩල නියෝග මින් ප්‍රකාශයට පත් කරමි.

ගාමිණී විජිත් විජයමුණි සොයිසා,
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය.

2017 මාර්තු මස 15 වැනි දින,
කොළඹ,
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ දී ය.

1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 12(1) වගන්තියේ සඳහන්
කාරණා සම්බන්ධයෙන් එකී පනතේ 16(1) හා 16(2) වගන්තිය යටතේ ක්‍රියාත්මක නියෝග

(1) මොනයම් රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක්, රාජ්‍ය නොවන සංවිධානයක් හෝ ආයතනයක් හෝ පුද්ගලයකු මින් ඉදිරියට පහත සඳහන් කාර්යයන් හෝ ව්‍යාපෘතීන් සඳහා, ස්වාභාවික ජල උල්පතක් හෝ ගැඹුරු හෝ නොගැඹුරු භූගත ජලය භාවිතා කරනු ලබන්නේ නම්,

එම කාර්යයේ හෝ ව්‍යාපෘතියේ සම්පූර්ණ තොරතුරු ඇතුළත් කළ ව්‍යාපෘති යෝජනාව, ජල සම්පත් මණ්ඩලයේ අධීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතු අතර ජල සම්පත් මණ්ඩලය විසින් දෙනු ලබන නියමයන්ට අනුකූලව එම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු ය.

එකී කාර්යය හෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ජල සම්පත් මණ්ඩලයේ නිසි ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය.

එනම්,

(අ) කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදි කරනු ලබන විෂ්කම්භය මීටර් 4ක් හෝ ඊට වැඩි වගා ළිං ;

(ආ) වාණිජමය කෘෂිකාර්මික කටයුතු හා කර්මාන්ත අවශ්‍යතා සඳහා ඉදිකරනු ලබන නිෂ්පාදන නල ළිං හා වල ළිං හෝ ස්වාභාවික ජල උල්පත්, නිෂ්පාදන නල ළිං, වල ළිං, යොදාගනිමින් කරනු ලබන වාණිජමය, කෘෂිකාර්මික කටයුත්තක් ව්‍යාපාරයක් හෝ වෙනත් ඕනෑම කර්මාන්තයක් (ඇමුණුම 01).

(2) නල ළිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු ය.

1A - G 25277 — 27 (2017/03)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

නල ළිං ඉදිකිරීම ජල සම්පත් මණ්ඩලය විසින් ලබා දෙනු ලබන උපදෙස් අනුව සිදු කළ යුතු අතර පරිසරයට හානි නොවන පරිදි එයින් ලබා ගත හැකි ජල ප්‍රමාණයන් නිවැරදි ලෙස තක්සේරු කිරීම ජල සම්පත් මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදුකර ඊට අදාළ අනුමැතිය ලබා ගත යුතු ය. ඒ අනුව දිනකදී ලබාගන්නා ජල ප්‍රමාණය මැනීම සඳහා අදාළ ආයතනය විසින්ම ජල මීටර (flow meter) සවිකිරීම සිදු කළ යුතු අතර දෛනිකව ලබා ගන්නා ජල ප්‍රමාණයන් පිළිබඳ දත්තයන් නඩත්තු කිරීම කළ යුතු ය. අවශ්‍ය අවස්ථාවන්හිදී පරීක්ෂා කිරීම සඳහා මෙය ඉදිරිපත් කිරීමට අදාළ ආයතනය බැඳී සිටී.

ඉහත ලියාපදිංචි ආයතන විසින් නව ඉදිකිරීම් සිදු කරනු ලබන්නේ නම් එසේ ඉදිකරනු ලබන සියලු ගැඹුරු හෝ නොගැඹුරු නල ළිං පිළිබඳ පහත දක්වෙන දත්තයන් සෑම මාස 03 කට වරක් ජල සම්පත් මණ්ඩලය වෙත ලබාදිය යුතු ය. (ඇමුණුම 02, අමුණුම 03)

ජල සම්පත් මණ්ඩලය විසින් මෙම දත්තයන් මණ්ඩලයේ දත්ත පද්ධතියට ඇතුළත් කරනු ලබන අතර ඒවා භූගත ජල සම්පත් කළමනාකරණය සඳහා ද ඉදිරි ව්‍යාපෘති සැලසුම්කරණය සඳහා ද භාවිතා කෙරේ.

(3) ජලය බෝතල කිරීමේ කාර්මාන්තයෙහි, බීම නිෂ්පාදනයෙහි නියැලෙන මොනයම් රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ ආයතනයක් හෝ පුද්ගලයකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේ නම් එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියක් සෑම මාස 06 කට වරක් රජයේ පිළිගත් රසායනාගාරයකින් (ඇමුණුම 04) මගින් සිදුකර අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත යොමු කළ යුතු ය.

(4) වාණිජමය කෘෂිකර්මාන්තය සඳහා හෝ කර්මාන්ත සඳහා (ඇමුණුම 05) මසකට ලීටර් 30000 ක භූගත ජලය ලබාගන්නා වූ ව්‍යාපෘති සඳහා අදාළ ජල ප්‍රභවය සම්බන්ධව තත්ත්ව වාර්තාවක් (Perimeter Protection Report) ජල සම්පත් මණ්ඩලයෙන් ලබාගත යුතු වේ.

(5) ස්වාභාවික ජල උල්පතක් හෝ භූගත ජලය උපයෝගී කර ගනිමින් නිෂ්පාදන හෝ සේවා කටයුතු සිදුකරනු ලබන ආයතන හෝ ස්ථාන පූර්ව දැනුම් දීමක් සහිතව හෝ රහිතව දවසේ කුමන හෝ සාධාරණ කාලයන්හි දී එකී නිෂ්පාදන හෝ සේවා ස්ථානවලට ඇතුලු වී පරීක්ෂා කිරීමේ අයිතිය ජල සම්පත් මණ්ඩලය සතු ය.

(6) ඉහත ඡේදයන්හි විස්තර කර ඇති පරිදි කටයුතු නොකරන රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ පුද්ගලයෙකුට එරෙහිව 1964 අංක 29 දරන හා සංශෝධිත 1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය අනුව නීත්‍යානුකූලව කටයුතු කිරීමට ජල සම්පත් මණ්ඩලය විසින් ක්‍රියා කරනු ඇත.

*ඇමුණුම 01*

**ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය උපයෝගී කරගනිමින් කරනු ලබන කර්මාන්ත වන්නේ**

01. පානීය ජල බෝතල් කර්මාන්තය
02. වෙනත් බීම නිෂ්පාදන කර්මාන්ත
03. රෙදි සෝදන ස්ථාන
04. වාහන සේවා ස්ථාන
05. හෝටල් කර්මාන්තය
06. පැල තවාන්
07. කෘෂිකාර්මික ගොවිපළ
08. සත්ව පාලන ගොවිපළ
09. පෞද්ගලික මට්ටමින් ජලය විකුණනු ලබන ස්ථාන
10. කොහු සහ රබර් ආශ්‍රිත කර්මාන්තශාලා
11. අයිස් කර්මාන්ත ශාලා
12. ජල සම්පත් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් කර්මාන්ත

*ඇමුණුම 02*

ගැඹුරු හා නොගැඹුරු නළ ළිංවලට අදාළ දත්තයන් වනුයේ

01. ළිඳ පිහිටි ස්ථානය : GPS ඛණ්ඩාංක
02. භූ භෞතික විද්‍යාත්මක දත්ත
03. ළිඳේ විෂ්කම්භය
04. ළිඳේ ගැඹුර
05. ළිඳේ පස් හා පාෂාණ සම්බන්ධ ලොග් වාර්තා
06. ළිඳේ විදුම් වාර්තාව
07. ළිඳේ ජල මට්ටම
08. ළිඳේ පොම්ප පරීක්ෂණ වාර්තාව
09. ළිං ජලයේ ගුණාත්මකතාව සම්බන්ධ වාර්තා (භෞතික, රසායනික, බැක්ටීරියා, ක්ෂුද්‍ර ජීවී සහ බැර ලෝහ පරීක්ෂාවන් ඇතුළත්ව)
10. ළිඳේ පාෂාණවල පිහිටි කුස්තුරවලට අදාළ විස්තර

*ඇමුණුම 03*

කෘෂි වගා ළිංවලට අදාළ දත්තයන් වනුයේ

01. ළිඳ පිහිටි ස්ථානය
02. භූ භෞතික විද්‍යාත්මක දත්ත
03. ළිඳේ විෂ්කම්භය
04. ළිඳේ ගැඹුර
05. තද පාෂාණය දක්වා හාරා ඇත්ද යන බව
06. ළිඳේ ජල මට්ටම
07. ළිඳේ පොම්ප පරීක්ෂණ වාර්තාව
08. ළිං ජලයේ ගුණාත්මකතාව සම්බන්ධ වාර්තා

*ඇමුණුම 04*

රජයේ පිළිගත් රසායනාගාර

01. කාර්මික තාක්ෂණික ආයතනය
02. ජල සම්පත් මණ්ඩලය
03. ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
04. ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය
05. භූ විද්‍යා හා පතල් කාර්යාංශය
06. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය

*ඇමුණුම 05*

ඇමුණුම 01 න් දක්වා ඇති සියලුම කර්මාන්ත අයත් වේ.

03 - 1241

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# 2016 වර්ෂය තුල ජල සම්පත් මණ්ඩලය මගින් ක්‍රියාත්මක කල ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතියෙහි සාරාංශය

**2.1 භාණ්ඩාගාර ප්‍රතිපාදන ව්‍යාපෘති**

**ජල සම්පත් මණ්ඩලය විසින් 2017 වසරේ භාණ්ඩාගාර සහ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 08ක් පවත්වන ලද අතර ප්‍රධාන කාර්යාලයේ හා අනෙකුත් සියලු පළාත් කාර්යාල වල එම ව්‍යාපෘති ක්‍රියාත්මක විය.**

**2.1.1 ශ්‍රී ලංකාවේ වඩාත් සංවේදී භූගත ජල කලාපයන්හි ජලයේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මකභාවය පිළිබඳ දීර්ඝ කාලීන දත්ත එක් රැස් කිරීම සහ අධීක්ෂණ ව්‍යාපෘතිය**

**(රු2.5. මිලියන)**

මෙම ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාවේ වඩාත් සංවේදී භූගත ජල කලාපයන්හි ජලයේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මකභාවය පිළිබඳ දීර්ඝ කාලීනවලෙස දත්ත එක් රැස් කිරීම සහ අධීක්ෂණය. මෙය ව්‍යාපෘති 06 කකින් ඒකාබද්ධ වූ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය ආරම්භයේදී, අධීක්ෂණ ජාලය ස්ථාපිත කිරීමට භූගත ප්‍රශ්න සලකා එක් එක් ව්‍යාපෘතිප්‍රදේශ හඳුනාගෙනපරීක්ෂණ සිදුරු විදීම සිදුකරන ලදී.

**2.1.2 යාපනය දිස්ත්‍රික්කයේ භූගත ජල නිමාන ජාලය සංවර්ධනය කිරීම (රු. මිලියන 3.5 ක්)**

මෙම අධ්‍යනයේප්‍රධාන අරමුණ වන්නේ තෝරාගත් ප්‍රදේශවල භූගත ජලයේ ස්වභාවය හඳුනා ගැනීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කර භූගත ජලය වර්ධනය වීම නිරීක්ෂණය කිරීම සඳහා දීර්ඝ කාලීන නිමාන ජාලයක් ස්ථාපනය කිරීම සහඅවසානයේදී ප්‍රදේශයේ භූගත ජල ආකෘතියක් සකස් කිරීම වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ භූ විද්‍යා සමීක්ෂණ සිදු කිරීම,පර්යේෂණ නළ ළිං ඉදි කිරීම,ජල ධාරිතා පර්යේෂණ සිදු කිරීම, සම්මත මිම්මකට ළිං වල ජල මට්ටම නිර්ණය කිරීම,ජල මට්ටම් නිර්ණය කිරීම,ජල නියැදීන් ලබා ගැනීම, සහ දත්ත නිමාන කටයුතු සිදු කිරීම හා ජලයේ ගුණාත්මක භාවය පරීක්ෂා කිරීම.

ලබා ගත් ජල නියැදින් විශ්ලේෂණ කිරීමෙන් ලැබුණු ප්‍රතිපල අනුව විද්‍යුත් සන්නායකතාව,ලවණතාවය,නයිට්‍රේට්,ටී.ඩී.එස්, ක්ලෝරයිඩ්, සහ ජල මට්ටම් වල මෝසම් වර්ෂා කාලයට පෙර සහ පසු වෙනස් වීම් සිදුවන බව පෙනී ගොස් ඇත.

**2.1.3 කාලගුණික විපර්යාස හේතුකොට ගෙන වෙරළාසන්න භූගත ජලධරයන්ට ඇතිවිය හැකි ඍජු හා වක්‍ර බලපෑම පිළිබඳ අධ්‍යනය(රුපියල්. මිලියන 2.5 ක්)**

භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතියක් වන අතර කාලගුණික වෙනස් වීම් නිසා දිවයිනේ බස්නාහිර සහ නැගෙනහිර වෙරළාසන්න ජල ධරයන්ට ඇති විය හැකි භූ ගත ජලය පිළිබඳ ගැටළු හඳුනා ගැනීම සඳහා 2015 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

ව්‍යාපෘතියේ අරමුණ ඉටුකර ගැනීම පිණිස කොළඹ සිට වැලිගමදක්වා බස්නාහිර වෙරළ ආසන්න කලාපය තුළ සහ නැගෙනහිර වෙරල තිරයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිමාන ජාලයක් ස්ථාපනය කිරීම සඳහා ළිං 74ක් තෝරා ගන්නා ලදී.( නොගැඹුරු ළිං 50 ක් සහ පර්යේෂණ ළිං 24)

මීට අමතරව නැගෙනහිර වෙරළ තිරයේ භූගත ජල නිමාන ප්‍රදේශය මුලතිව් දිස්ත්‍රික්කය දක්වා පුළුල් කිරීම සඳහා මුලතිව් දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශ වල පර්යේෂණ නළ ළිං 08ක් ඉදි කරන ලදී.මෙම නළ ළිං වල ජල ධාරිතාව විනාඩියකට ලීටර් 30 සිට ලීටර් **750** දක්වා විය.

මෙම ඉදිකරන ලද පර්යේෂණ නළ ළිං මගින් අවට පරිසරයට හානියක්ඇති නොවී ලබා ගත හැකි උපරිම ආරක්ෂිත ජල ධාරිතාව නිර්ණය කිරීම සඳහා සහ විද්‍යුත් සන්නායකතා අගයන් සලකා බලා මුහුදු ජලය මිශ්‍රවීම සම්බන්ධයෙන් නිර්ණය කිරීම සඳහා ජල ධාරිතා පරීක්ෂණයද සිදු කරන ලදී.

නිමාන කටයුතු වලදී ලබා ගත් දත්ත විශ්ලේෂණ ප්‍රතිපල අනුව විද්‍යුත් සන්නායකතාවය සහ ලවණතාවය වැනි පැරාමිතින්ගේ අගයන් වියළි කාලයේදී ඉහළ යන බවත් තෙත් කාලයේදී පහළ යන බවත් පෙනී ගොස් ඇත.කලපුව ආසන්නයේදී නොගැඹුරු භූගත ජලයේ ගුණාත්මකභාවය ඉතා අඩු වුවත් මුහුද ආසන්නයේදී ගුණාත්මකභාවය සංසන්දනාත්මකව හොද තත්වයක පවතී.වර්ෂාපතන රටාව අනුව සහ වඩදිය බලපෑම අනුව ජල මට්ටම් අඩු වැඩි වීම, ජල ධරයේ ජලයේ ගුණාත්මක භාවය මේ අයුරින් වෙනස් විමට බලපා ඇති බව පෙනීයයි.එසේ වුවද වඩදිය බලපෑම හඳුනා ගැනීම අසීරු කරුණකි.

**නිර්දේශ හා අනාගත සැලසුම්**

- වෙරළාසන්න ජල ධරවල භූ ගත ජලයේ රසායනික පැරාමිතින් කාලගුණිකවිපර්යාස අනුව වෙනස් වන ආකාරය නිමානය කිරීම.
- ජල මට්ටම් විචලනය වීම හඳුනා ගැනීම.
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වෙරළාසන්න ජල ධරයේ භූගත ජලයේ ලවණතාවය,විද්‍යුත් සන්නායකතාව,pH අගය සහ ක්ලෝරයිඩ් මට්ටම් විචලනය වන ආකාරය නිර්ණය කිරීම.
- සමස්ථානික**(isotope)** තාක්ෂණය භාවිතාකරමින් භූ ගත ජලයට මුහුදු ජලය මිශ්‍රවී ඇති ප්‍රදේශ හඳුනා ගැනීම.

- ඇති විය හැකි කාලගුණික තත්ත්වයන් නිසා වෙරළාසන්න වැලි සහිත ජල ධරයට සිදුවියහැකි බලපෑම් සහ අවදානම් ප්‍රදේශ හඳුනාගැනීම.
- භූගත ජලය කෘතිමව ආරෝපණය කලහැකි ප්‍රදේශ හඳුනා ගැනීම.

**2.14 හඳුනා නොගත් වකුගඩු ආශ්‍රිත රෝගය පවතින අම්පාර, කුරුණෑගල, ත්‍රිකුණාමලය, හම්බන්තොට,බදුල්ල, මොණරාගල, සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ අධ්‍යනය(රු.මිලියන 5.0)**

2017 වර්ෂයේදී මෙම අධ්‍යනය කුරුණෑගල,ත්‍රිකුණාමලය,හම්බන්තොට,පොළොන්නරුව දිස්ත්‍රික්ක වල ක්‍රියාත්මක විය.භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ 20ක ප්‍රමාණයක් සිදු කිරීම,පර්යේෂණ නළ ළිං ප්‍රමාණයක් ඉදි කිරීම,500ක පමණ ජල නියදීන් ලබා ගැනිම හා දත්ත නිමාන කටයුතු සිදු කිරීම,150 ක පමණ ජලයේ ගුණාත්මක භාවය පරීක්ෂා කිරීම,10ක පමණ ජල සායන සහ දැනුවත් කිරීමෙ වැඩසටහන් පැවැත්විම හා 20 ක පමණ අත් පොම්ප නළ ළිං සවි කිරීම.එබැවින්,පර්යේෂණ නළ ළිං වල භූගත ජලයේ විද්‍යුත් සන්නායකතාව,සනත්වය,ෆ්ලෝරයිඩ් ප්‍රමාණය සහ pH අගය ඉදිරි වසර 05ක කාලයතුල විශ්ලේෂණය කිරීමද අවශ්‍ය වේ.

**2.1.5 කිරිදි ඔය ජල ද්‍රෝණියේ භූගත ජලය පිළිබඳ ඇගයීමේ අධ්‍යනය (රු.මිලියන 1.6)**

මෙම ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේ භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරිම(10),පර්යේෂණ නළ ළිං 10ප්‍රමාණයක් ඉදි කිරීම,ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම (10),සම්මත මිම්මකට ළිං වල ජල මට්ටම නිර්ණය කිරීම(35) ,ජල නියැදීන් ලබා ගැනීම සහ දත්ත නිමාන කටයුතු සිදු කිරීම(200) හා ජලයේ ගුණාත්මක භාවය පරීක්ෂා කිරීම(100).

**2.1.6 ගැඹුරු නල ළිං ඉදි කිරීම, පොම්ප සවිකිරීම සහ ජල පෙරණ සවිකිරීම සහ ජල පෙරණ සවි සවිකිරීම මගින් වියළි කලාපීය දිස්ත්‍රික්ක වල හදිසි හදිසි ආපදා අවශ්‍යතා සඳහා භූගත ජල සම්පත් සංවර්ධනය කිරීම.(රු.මිලියන 4.6)**

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණශ්‍රී ලංකාවේ වියලි කලාපයේ තුල ජල හිගයෙන්පීඩා විදින ග්‍රාමීය ජනතාවට පිරිසිදු හා ආරක්ෂිත පානීය ජලය ලබා දීම වේ. මේ යටතේ මොණරාගල ,කුරුණෑගල,පුත්තලම,මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කයේ වල 2017 වර්ෂයේ භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ 15ක ප්‍රමාණයක් සිදු කිරීම,පර්යේෂණ නළ ළිං15 ප්‍රමාණයක් ඉදි කිරීම,ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම(05),ජලයේ ගිල්වන පොම්ප සවි කිරීම(05).

**2.1.7 වියළි කලාපයේ අත් පොම්ප නළ ළිං පුනුරුත්තාපනය කිරිම.(රු.මිලියන 2.3)**

බදුල්ල,මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වල ග්‍රාමීය ප්‍රදේශ වල ජනතාව සදහා ආරක්ෂිත සහ පිරිසිදු පානීය ජලය ලබා දීම සදහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර 2017 වර්ෂයේ දී පැරණි නළ ළිං පිරිසිදු කිරීම(25),පැරණි අත් පොම්ප ප්‍රතිසංස්කරණය කිරීම(50) හා අත් පොම්ප සවි කිරීම (20) සිදු කරනව ලදී.

**2.1.8 අදාළ අනෙකුත් රාජ්‍ය ආයතන සමග ඒකාබද්ධව භූගත ජලසම්පත් ක්ෂයවීම සහ පරිසර දූෂණය වීම ආශ්‍රීත පාරිසරික ගැටළු පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණය සිදු කිරීම(රු.මිලියන 0.5)**

පස්,බොරළු,මැටි,වැලි කැණීම හා ගල් කැඩිම නිසාත් භූගත ජලය අධික ලෙස පොම්ප වලින් පොම්ප කිරීම නිසාත් ඇති වන භූගත ජල මට්ටම වල අඩු වීම සහ ජල දූෂණය යන පාරසරික වෙනස් වීම් අධ්‍යනය මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

මධ්‍යම පරිසර අධිකාරිය හා අනෙකුත් අදාළ ආයතනයන් හා මනා සම්බන්ධීකරණය සහිතව මෙම අධ්‍යනය සහ නිරීක්ෂණ සිදු කරන ලදී.මේ යටතේ මධ්‍යම පරිසර අධිකාරිය ,භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ,ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සහ අනෙකුත් අදාළ හා මනා සම්බන්ධීකරණය සහිතව මෙම අධ්‍යනය සිදුකරන ලදී.

## 2.2 අමාත්‍යාංශ අරමුදල් යටතේ සිදු කල භූ ගත ජල කළමනාකරණ ව්‍යාපෘති

මේ යටතේ ව්‍යාපෘතීන් 3ක් උතුරු පළාත් කාර්යාලය, ඌව පළාත් කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලදී.

**2.2.1 යාපනය අර්ධද්වීපය සඳහා භූගත ජල කළමනාකරණ සැලැස්ම සකස් කිරීම (රු. මිලියන 3.6)**

යාපනය අර්ධද්වීපයේ භූගත ජල කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ අරමුණ ඇතිව අර්ධද්වීපයේ භූගත ජල ප්‍රභවයන් පිළිබඳ තක්සේරු කිරීම සඳහා භූගත ජල අධ්‍යනයක් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් 5ක් යාපනය දිස්ත්‍රික් ලේකම්තුමා, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමා හා අනෙකුත් අදාළ ආයතන නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.තවද මේ සඳහා අවශ්‍ය GPS 80ක් හා විද්‍යුත් සන්නායකතා මාන (EC meter) 80ක් මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

**2.2.2 වාරි මාර්ග යෝජනා ක්‍රම ආශ්‍රිත ප්‍රදේශ වල නොගැඹුරු භූ ගත ජලධර වල ජලමට්ටම වෙනස්වීම හා ජලයේ ගුණාත්මකභාවය අධ්‍යනය කිරීම(රු. මිලියන 1.0)**

දත්ත රැස් කිරීම, භූජල විද්‍යා සමීක්ෂණ 25ක් සිදු කිරීම, පරීක්ෂණ නළළිං 25ක් ඉදිකිරීම, ජල සාම්පල එකතු කිරීම සහ ජල සාම්පල 13ක් විශ්ලේෂණය කිරීම2017 වසරේදී යාන් ඔය ජලාශ ප්රදේශයේ දී නිම කරන ලදී

**2018 සඳහා අනාගත සැලැස්ම**

1. නිමාන ජාලය ස්ථාපිත කිරීම සඳහා අඩුව පවතින දත්ත ලබාගැනීම පිණිස යාන්ඔය ජලාශය පිහිටි ප්‍රදේශයේ පර්යේෂණ නල ළිං 20ක් ඉදිකිරීම.
2. මල්වතු ඔය ජලාශය ප්‍රදේශයේ පර්යේෂණ නල ළිං 25ක් ඉදිකිරීම.

**2.2.3 වියළි කලාපීය ප්‍රදේශවල භූගත ජලය සංවර්ධන කිරීම(රු. මිලියන 15.0)**

මෙම ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේදී පහත සඳහන් කාර්යන් සිදුකරන ලදී.

**2.2.3.1 කොළඹ, රත්නපුර, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ කෑගල්ල දිස්ත්‍රික්ක වලගංවතුරින් හානියට පත් ප්‍රදේශවල ළිං පිරිසිදු කිරීම. (රු. 20.0 ක්)**

රත්නපුර දිස්ත්රික්කයේ ළිං 490ක් ද කළුතර දිස්ත්රික්කයේ ළිං 548ක් ද,මාතර දිස්ත්රික්කයේ ළිං 786ක්ද මෙම ව්යාපෘතිය යටතේ පිරිසිදු කරන ලදී.

මෙම වැඩසටහන තුළදීජල සාම්පල 784 ක pH අගය, සහ විද්යුත් සන්නායකතාවය හා බැක්ටීරියා විශ්ලේෂණය සිදුකරන ලදී.

**2.2.3.2 නියගයෙන් පීඩාවටපත් ප්රදේශවල ගැඹුරු නළ ළිං, වල ළිං ඉදිකිරීම්සහ ජල පොම්ප සවි කිරීම.**

මේ යටතේ 2017වසර තුලදී භූ ජල විද්‍යා සමීක්ෂණ 35ක් සිදු කිරීම,ගැඹුරු නල ළිං 30ක් ඉදි කිරීමසහ ජල පොම්ප 15ක් සවි කිරීම සිදු කරන ලදී.

ඊට අමතරව, පහත සඳහන් ජල සම්පාදන යෝජනා ක්‍රම මෙම ව්‍යාපෘතිය යටතේ නිම කරන ලදී.

1. තෝරතුපිටිය ඇතිමලේ කුඩා පරිමාණ සම්පාදන යෝජනා ක්රමය.
2. මොණරාගල දිස්ත්‍රික්කයේකුඩා පරිමාණ සම්පාදන යෝජනා ක්රමය
3. මොණරාගල දිස්ත්‍රික්කයේ පල්ලේගම පානීය ජල ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම.

**2.3 වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යපෘතිය(DSWRPP-AF) යටතේ ශ්‍රී ලංකාවේ තෝරා ගත් නියමු කලාප 07ක ස්ථාපනය කරන ලද භූගත ජල අධීක්ෂණ ජාලය පුළුල් කිරීම.**

ජලයේ ගුණාත්මක භාවය හා ප්රමාණාත්මකතාවය පිළිබඳව ගැටළු වාර්තා වී ඇති යාපනය,අනුරාධපුරය,මාතලේ,පුත්තලම,ගම්පහ සහ අම්පාර යන දිස්ත්‍රික්ක වල තෝරාගත් ප්රාදේශීය ලේකම් කොට්ඨාශවල මෙම අධ්‍යන කටයුතු සිදු කරන ලදී.




**රූපසටහන 01: ව්‍යාපෘතියේ 1 හා 2 අදියර වල නියමු ප්රදේශ සහ අලුතින් තෝරාගත් පොළොන්නරුවේ නියමුප්රදේශය දැක්වෙන සිතියම**

3. **මහජනතාවගෙන්,රාජ්‍ය ආයතන වලින් සහ අනෙකුත් ආයතන වලින් ලදඉල්ලීම් මත භූගත ජල සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකිරීම.**

මේ යටතේ 2017 වර්ෂයේදී ක්‍රියාත්මක වූ විශේෂ ව්‍යපෘති පහත දැක්වේ.

| අනු අංකය | ව්‍යපෘතියේ නම | ක්‍රියාත්මක කරන ලද වගකීම |
|---|---|---|
| 01 | චුන්නාකම් ප්‍රදේශයේ භූගත ජලයදූෂණය වීම සම්බන්ධයෙන් භූ ජල විද්‍යාත්මක අධ්‍යනය | ප්‍රධාන කාර්යාලය කොළඹ |
| 02 | යාපනයනගරසීමාව ආවරණය වන පරිදි පොකුණුප්‍රතිසංස්කරණය | ප්‍රධාන කාර්යාලය කොළඹ |
| 03 | මොරගහකන්ද සහ කළුගග නැවතපදිංචි කරන ලදප්‍රදේශ වල නල ළිං ඉදිකිරීම | ප්‍රධාන කාර්යාලය කොළඹ |
| 04 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ , පුනරුත්ථාපනනැවත පදිංචි කිරීමේ හා හින්දු කටයුතු අමාත්‍යාංශයේප්‍රතිපාදන මගින් උතුරු පළාතේ නැවත පදිංචි කිරීම සම්බන්ධ කාර්යා බලකාය යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ නල ළිං ඉදිකිරීම | ප්‍රධාන කාර්යාලය කොළඹ |
| 05 | කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක වල ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම- WASSIP(නගරය සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය) | ප්‍රධාන කාර්යාලය කොළඹ |

**වාණිජ්‍ය කටයුතු**

ඊට අමතරව ජනතාවගෙන්,රාජ්‍ය ආයතන වලින් සහ අනෙකුත් ආයතන වලින් ලැබුණු ඉල්ලීම් අනුව 2017 වර්ෂයේදී භූවිද්‍යා සමීක්ෂණ 659ක්,නළ ළිං ඉදි කිරිම 166ක් අත් පොම්ප සවි කිරීම 32ක්,ජල ධාරිතා පරීක්ෂණ 215ක්, නළ ළිං පිරිසිදු කිරීම් 36ක් ,ජල සාම්පල රසායනිකව විශ්ලේෂණ 756ක්,යකඩ පෙරන සවි කිරීම 34ක් සිදු කරන ලදී.

**විගණකාධිපතිවරයාගේ විගණන විමසුම හා විගණන වාර්ථාවල පෙන්වා දී ඇති ගිණුම්කරණ හා කළමනාකරණ දුර්වලතා නිවැරදි කිරීම පිණිස ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග.**

i. විගණනයෙන් පෙන්වා ඇති ගිණුම්කරණ අඩුපාඩු ජනල් සටහන් මාර්ගයෙන් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

ii. ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර නිසි පරිදි ක්ෂය කිරීමට කටයුතු කර ඇත.

iii. වාහන වල අයිතිය මණ්ඩලයේ නමට පවරා ගැනීමේ කටයුතු සිදුකර ඇත.

iv. භාන්ඩ සමීක්ෂන වාර්තා මගින් අනවශ්‍ය තොග හදුනාගැනීම සිදුකර ඇති අතර ඒවා අපහරනය කිරීමේ කටයුතු ක්‍රියාවලිය ආරම්භ කර තිබේ.

v. කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි අනුමත වෘතීය දීමනාව 2017 වර්ෂයේ වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිටක්‍රියාත්මක කර ඇත.

vi. පර්යේෂන අධ්‍යානයන්හි පවතින අඩුපාඩු ක්‍රමිකව අඩුකර ගැනීමට කටයුතු සලස්වා ඇත.

# ජල සම්පත් මණ්ඩලයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග

ජල සම්පත් මණ්ඩලය දැනට ශ්‍රී ලංකාවේ ජල සම්පත් සම්බන්ධයෙන් අධ්‍යයන කටයුතුවල නිරත වේ. 2016 වසර සඳහා ප්‍රධාන වශයෙන් අධ්‍යයන ව්‍යාපෘති 14ක් ක්‍රියාත්මක කරන ලද අතර මණ්ඩලයේ කටයුතු වල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම පිණිස පහත දැක්වෙන ක්‍රියා මාර්ග ගෙන ඇත.

01. භූගත ජල සම්පත් කළමනාකරණය කිරිම සහා අදාල රෙගුලාසි පැනවීමට පියවර ගැනීම.

02. ජල සම්පත් මණ්ඩලය සඳහා හදිසි මෙහෙයුම් අංශයක් ඇති කිරීම තුලින් භූගත ජලයට අදාල රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටළු සම්බන්ධව කටයුතු කිරීමට හැකි වාතාවරණයක් ඇති කිරීම

03. ස්ථාවර වත්කම් කළමනාකරණය සහ පාලනය වඩාත් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා මෘදුකාංග යොදා ගැනීම තව දුරටත් ක්‍රියාත්මක කිරීම.

04. අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය (ප්‍රධාන වශයෙන් භූජල විද්‍යාඥයින්, රසඥවරුන් සහ තාක්ෂණික නිලධාරින්) බඳවා ගැනීම.

05. මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය සම්පාදනය කිරීම

06. කාර්ය මණ්ඩලයට අවශ්‍ය කළමනාකරණ සහ තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා පුහුණුවීම් ලබා දීම.

07. මණ්ඩලයේ සියලුම අංශ වල ප්‍රගතිය සති පතා පරීක්ෂා කිරීම.

08. මණ්ඩලයේ සියලු කටයුතු පිළිබඳව පසු විපරම් කිරීම.



2ඒ, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07.

2A, ஹெக்டர் கொப்பேகடுவ அவென்யூ, கொழும்பு 07.

2A, Hector Kobbakaduwa Avenue, Colombo 07.